# මරණ වරෙන්තුව සාමාන්‍ය වූ සමාජයක වත්මන් මොහොත

# [මර්දනය ගැන අසම්පූර්ණ වාර්තාවක්]

වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන එකමුතුව

# පෙළගැස්ම


හැඳින්වීම

රාජ්‍ය මර්දනය සංක්ෂිප්තව

2020 සිට 2022 මාර්තු දක්වා මර්දනය පිළිබඳව කෙටියෙන්

2022 මාර්තු 31 සිට 2022 ජූලි 13 දක්වා රාජ්‍ය මර්දනය

2022 ජූලි 13 සිට 2022 අගෝස්තු 23 තෙක් මර්දනය

විරෝධතාවලට විෂ සහිත කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම

මෑතකදී සිදු වූ වෙඩි තැබීම්

මෑතකදී මුහුදු වෙරළට මළ සිරුරු ගොඩගැසීම්

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පැවැති සිවිල් යුද්ධයේ අවසානයෙන් පසු (2009) මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වැඩිම ප්‍රමාණයක් වාර්තා වන්නේ 2019 නොවැම්බර් මාසයේදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයට පත්වීමත් සමග ය. ඔහු ඒ වනවිටත් මහාධිකරණයේ විභාග වෙමින් පැවැති නඩුවක සැකකරුවෙකි. එමෙන්ම ජනමාධ්‍යවේදීන් පැහැර ගැනීම, ඝාතනය කිරීම සහ හිංසා කිරීම සම්බන්ධ නඩු කිහිපයකම සැකකරුවකු ලෙෂ සාක්ෂි අනුව නම් කිරීමට නියමිතව සිටි අයෙකි. ගෝඨාභය රාජපක්ෂ 2019 නොවැම්බර් 16 පැවැති ජනාධිපතිවරණයට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරමින් ඉදිරිපත් වූ අතර, ඡන්ද ලක්ෂ 69ක් ලබාගෙන ඔහු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස තේරී පත් විය.

ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙසත්, ඔහුගේ සහෝදරයා ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිවරයා ලෙසත් කටයුතු කළ 2005 - 2015 කාලයේ රාජපක්ෂ රෙජීමය විසින් සිදු කරනු ලැබූ අපරාධ සම්බන්ධයෙන් විමර්ශන සිදු කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රැසක් එම දෙපාර්තමේන්තුවෙන් ඉවත් කිරීම ඔහුගේ පළමු රාජකාරිය විය. එයින් ආරම්භ වූ මර්දනය නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම්, නීතිවිරෝධී රඳවා තබාගැනීම්, ව්‍යාජ චෝදනා මත නඩු පැවරීම්, බලපෑම් කිරීම්, පහරදීම්, පැහැර ගැනීම් සහ ඝාතනය කිරීම් දක්වා වූ විශාල පරාසයක් තුළ විහිදී තිබේ.

2019 වසරේදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු ආරම්භ වූ බරපතළ මානව හිමිකම් කඩවීම්, ජන අරගලයක් මගින් ඔහු බලයෙන් පහකිරීමෙන් පසු පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීමකින් විධායක ජනාධිපති ධුරයට පත් රනිල් වික්‍රමසිංහගේ නායකත්වයෙන් යුත් ආණ්ඩුවෙන් ද නොකඩවා, නොවෙනස්ව කරගෙන යමින් තිබේ.

රාජ්‍ය ත්‍රස්තවාදයක ස්වරූපයෙන් සිදුවන මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් දළ අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම වාර්තාව සකස් කරනු ලබන අතර, මෙය අපට වාර්තා වූ තොරතුරු මත පමණක් ගොඩනගන ලද්දකි. වාර්තා නොවූ සහ තහවුරු කර ගැනීමට හැකියාවක් නොලැබුණු තවත් මානව හිමිකම් කඩවීම් රැසක් මෙම නිශ්චිත කාලයට අදාළ ව රට පුරා සිදුවී තිබේ.

මෙම වාර්තාව සකස් කිරීමට වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන එකමුතුවේ සාමාජික සංවිධාන සොයාගත් තොරතුරු මෙන්ම සමාජ හා සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම සොයාගත් තොරතුරු ද උපයෝගී කරගෙන තිබේ.

මෙම රාජ්‍ය ත්‍රස්තවාදයට එරෙහි වන ලෙසත්, මර්දනය වහාම නතර කරන ලෙසත් ආණ්ඩුවටත්, ආණ්ඩුවේ අවශ්‍යතා මත කටයුතු කරන ශ්‍රී ලංකා පොලීසිය සහ ත්‍රිවිධ හමුදාවලටත් බලපෑම් කරන ලෙස ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සහ මානව හිමිකම්වලට ගරු කරන ශ්‍රී ලංකාවේ සියලුම දේශපාලන පක්ෂවලින්, ශ්‍රී ලංකාවේ පිහිටි සියලුම රටවලට අයත් තානාපති කාර්යාල හා මහ කොමසාරිස් කාර්යාලවලින් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය, යුරෝපා සංගමය ඇතුළු අන්තර්ජාතික සංවිධානවලින් අපි ඉල්ලා සිටිමු.

**- වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන එකමුතුව**

65/3, චිත්තපප්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

# රාජ්‍ය මර්දනය සංක්ෂිප්තව

මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී චෝදනා ලැබ සිටි හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ තම ධූර කාලය තුල විශේෂයෙන්ම අත්තනෝමතික ලෙස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නිසාවෙන් ජනතාව අතරින් පැන නගින ලද විරෝධයන් ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස මර්දනය කිරීම සාමාන්‍යකරණය ව පැවතිණි. 2021 ගුරු වර්ජනය මර්දනය කිරීම සඳහා නිරෝධායන නීතිය යොදා ගැනීම හා වසංගතය පාලනය කිරීමේ මුවාවෙන් ජනතාවට විරෝධය පල කිරීමට ඇති අයිතිය සීමා කිරීම හා උල්ලංඝණය කිරීම, ගොවි උද්ඝෝෂණ හා ගුරු උද්ඝෝෂණ මාධ්‍ය හරහා අපවාදයට ලක් කිරීම මෙන්ම විශේෂයෙන්ම මුස්ලිම් ජාතික කීර්තිමත් සිවිල් ක්‍රියාධරයින්ට එරෙහිව ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම මේ අතරින් කැපී පෙනේ. ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති භාෂණයේ නිදහස, රැස්වීමේ නිදහස, ආගම ඇදහීමේ නිදහස, වධබන්ධනයන්ගෙන් නිදහස් වීමේ නිදහස මෙන්ම ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය තුල හඳුනාගනෙ ඇති ජීවත් වීමේ අයිතිය ආදිය නිරන්තරයෙන් උල්ලංඝණය වීම ගෝඨාභය රාජපක්ෂ පාලන සමයේදී සාමාන්‍යයක් විය.

ආර්ථික අර්බුදය ඉදිරියේ රජයට එරෙහිව සාමකාමී ලෙස උද්ඝෝෂණය කරන ලද ජනතාවට එරෙහිව ප්‍රචණ්ඩත්වය යොදා ගැනීම, උද්ඝෝෂණය කිරීමට ඇති නිදහස අහුරවාලමින් අධිකතර බලය යොදමින් උද්ඝෝෂණ විසුරවාලීම, උද්ඝෝෂකියින්ට එරෙහිව විෂ කඳුලු ගෑස් වැනි රසායනික අවි භාවිතය, උද්ඝෝෂකයින් අත්අඩංගුවට ගැනීම, පෙලපාලි වලක්වමින් උසාවි නියෝග ලබා ගැනීම 2022 මාර්තු 31 වන දින සිට මේ දක්වා අපට දක්නට ලැබේ. ගෝටාබය රාජපක්ෂ ජනාධිපතිවරයාට ඉල්ලා අස් වන ලෙස ඉල්ලමින් ලක්ෂ සංඛ්‍යාත ජනයා කරන ලද උද්ඝෝෂණ පොදුවේ ගත් කල ඉතාමත් සාමකාමී වූ නමුත් මාර්තු 31 වන දින මිරිහානේදී උද්ඝෝෂකයින්ට පහර දීම හා අත්අඩංගුවට ගැනීම මගින් ”අරගලයට” එරෙහිව ආරම්භ කරන ලද මර්දනය මේ වන තෙක්ම අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

දූෂිත දේශපාලන සංස්ථාපිතයට එරෙහිව පොදු ජනතාව විසින් අඛණ්ඩව සිදු කරනා ලද උද්ඝෝෂණ, වැඩ වර්ජන, හර්තාල් හා පොදු දේපල අත්පත් කර ගැනීමේ ක්‍රියාමාර්ග ජනතාව විසින් සාමූහිකව සිය දේශපාලන අයිතිවාසිකම් අභ්‍යාස කිරීමක් වුවද, රජය සෑම අවස්ථාවකදීම බලහත්කාරයෙන් ජනතාව පාලනය කිරීම සුජාත කරමින් හා ජනතා විරෝධයන්වල ඇති දේශපාලන සුජාතබව ප්‍රතික්ෂේප කරමින් කටයුතු කර ඇත. උදාහරණයක් ලෙස 2022 මැයි මස 09 වන දින එවකට අගමැති මහින්ද රාජපක්ෂ හා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණු නායකත්වය විසින් සාමකාමී උද්ඝෝෂකියින්ට අමානුෂික පහර දීමට මැරයින් මෙහෙයවීම මගින් ජනාතව වෙත ප්‍රචණ්ඩත්වය මුදා හැරීම නිසාවෙන් මැයි 9 වන දින ඉතාමත් අවාසනාවන්ත ලෙස රට පුරා දේපල හානි හා ජීවිත හානි සිදු විය. ප්‍රචණ්ඩත්වට තුඩු දුන් අගමැතිවරයාගේ ක්‍රියාකලාපය කිසිදු ආකාරයකින් විමර්ශනය කිරීමකින් තොරව සාමාන්‍ය ජනතාව දහස් ගණනින් අත්අඩංගුවට ගැනීම් සිදු කරන ලදි. මෙම තත්ත්වය 2022 ජූලි 09 වන දිනට පසුව දිග හැරෙන මර්දනය තුලද දක්නට ලැබේ. මැයි 9 වන දින සිට රජය විසින් අත්අඩංගුවට ගන්නා ලද පිරිස 3500 කටත් අධික වන අතර ඉන් 1249 ක් මේ වන විටත් රිමාන්ඩ් බන්ධනාගාර ගත කර ඇත.

2022 මාර්තු 31 වන දින සිට අද වන තෙක් උද්ඝෝෂකයින්ට එරෙහිව රජය අවස්ථා කිහිපයකදී ප්‍රචණ්ඩත්වය යොදාගෙන ඇති අතර 2022 අප්‍රේල් 18 වන දින රඹුක්කනදී උද්ඝෝෂකයින්ට වෙඩි තැබීම නිසාවෙන් එක් පුද්ගලයෙක් මිය ගියේය. 2022 මැයි 09, ජූලි 09 හා ජූලි 22 වන දිනයන්හිදීද සාමාකාමී උද්ඝෝෂකයින්ට එරෙහිව රජය විසින් ප්‍රචණ්ඩත්වය භාවිතා කරන ලදි.

2022 ජූලි 13 වන දින ගෝඨාභය රාජපක්ෂ රට හැරදා පලා යාමත් සමග ජනාධිපති ලෙස පත්වන ලද රනිල් වික්‍රමසිංහ තමන් පත්වන ලද දිනයේ සිටම හදිසි නීතිය පනවන ලද අතර ගෝල්ෆේස් අරගලයේ

ක්‍රියාකාරීන්ට එරෙහිව ක්‍රියාත්මක වීම ආරම්භ කරන ලදි. ඒ අනුව නීතිඥවරුන්, ජනමාධ්‍යවේදීන්, ආගමික නායකයින්, වෘත්තීය සමිති නායකයින්, ශිෂ්‍ය නායකයින් හා දේශපාලන ක්‍රියාකාරිකයින් අත්අඩංගුවට ගැනීම ආරම්භ කරන ලදි. කිසිදු ආකාරයකින් ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සම්බන්ධ නොවන ලද සාමාකාමී ලෙස උද්ඝෝෂණය කරමින් තම දේශපාලන අයිතිවාසිකම් අභ්‍යාස කරන ලද ක්‍රියාකාරීන් බිය වැද්දීම, හිරිහැරයට ලක් කිරීම හා ඔවුන්ව නිහඬ කිරීම රනිල් වික්‍රමසිංහගේ උපායමාර්ගය බවට පත්ව ඇත.

මෙම තත්ත්වය භයානක ලෙස වර්ධනය වීමක් 2022 අගෝස්තු මස 18 වන දිනදී අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු ඇතුලු ශිෂ්‍ය ක්‍රියාකාරීන් තිදෙනෙකු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රැඳවුම් භාරයට ගැනීම, පැය 24 කට අධික කාලයක් නීති විරෝධී ලෙස රඳවා තබා ගැනීම හා දින 90 ක කාලයකට රැඳවුම් නියෝග මගින් රඳවා තබා ගැනීමට තීරණය කිරීම හරහා දක්නට ලැබේ.

සාමාකාමී උද්ඝෝෂකයින් ත්‍රස්තවාදීන් ලෙස නාමකරණය කරමින් ඔවුන්ගේ දේශපාලන නිදහස සහමුලින්ම අහෝසි කර දමමින් ජාත්‍යන්තර හා ජාතික මානව හිමිකම් නීතිය උල්ලංඝණය කරනා ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත වැනි අපකීර්තිමත් නීති භාවිතා කරමින් කිසිදු අධිකරණමය හා ව්‍යවස්ථාදායකයේ අධීක්ෂණයකින් තොරව විධායකයේ අත්තනෝමතික හා මර්දනීය තීරණ මත ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් කප්පාදු කිරීම ඉතාමත් භායනක ප්‍රවණතාවයක් ලෙස හඳුනා ගත යුතු වේ.

# 2020 සිට 2022 මාර්තු දක්වා මර්දනය පිළිබඳව කෙටියෙන්

ගෝඨාභය රාජපක්ෂ, 2019 නොවැම්බර් 16 ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු ගන්නා ලද ඇතැම් තීන්දු නිසා සහ ගත යුතු තීන්දු නිසි කාලයට නොගැනීම නිසා රටේ කාලාන්තරයක් තිස්සේ පැවැති දේශපාලන සහ ආර්ථික අර්බුදය ඔඩු දුවන්නට විය. ඒ හේතුවෙන් 2021 වන විට රට පුරා සැලකිය යුතු සංඛ්‍යාවක් උද්සෝෂණ පැවැත්විණි.

මෙම උද්සෝෂණ තීව්‍ර වන විට ඒවා පාලනය කිරීම සඳහා ආණ්ඩුව පාර්ශ්වයෙන් විවිධ උපායමාර්ග අනුගමනය කළේය. ඇතැම් උද්සෝෂණවලට පහර දුන් අතර, ඇතැම් උද්සෝෂණවලට එරෙහිව අධිකරණ නියෝග ලබාගැනීමට උත්සාහ කළේය.

2021 අවසන් මාස හයේදී පමණක් පැවැති උද්සෝෂණ සංඛ්‍යාව 400කට අධික වේ. අපට වාර්තා වූ එම උද්සෝෂණවලින් වැඩි ප්‍රමාණයක් පැවතුණේ නිදහස් අධ්‍යාපනය රැකගැනීම, ආණ්ඩුවේ රසායනික පොහොර තහනම නිසා වගාවට සිදුවන හානිය, අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ඉහළ යෑම, වැඩි වන ජීවන වියදමට සරිලන සහන හෝ වැටුප් වැඩිවීම් ලබාගැනීම සහ භාෂණයේ ප්‍රකාශනයේ අයිතිය රැකගැනීම යන මාතෘකා මුල් කරගනිමින් ය.

මෙම උද්සෝෂණ තහනම් කිරීම සඳහා අධිකරණ නියෝග ලබාගැනීමට පොලිසිය උත්සාහ කළ අවස්ථා ද රැසක් වාර්තා විය. ඊට අමතරව නිරෝධායන නීතිය ඇතුළු විවිධ නීති පෙන්වමින් උද්සෝෂකයන් මර්දනය කිරීමට ආණ්ඩුව දිගින්-දිගටම උත්සාහ කළේය. අධිකරණයෙන් ඇප ලැබී තිබියදීත්, ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝෂප් ස්ටාලින් ඇතුළු වෘත්තීය සමිති නායකයන් සහ සිවිල් ක්‍රියාකාරීන් පිරිසක් බලහත්කාරයෙන් රැගෙන ගොස් හමුදා කඳවුරක සහ තවත් ස්ථානයක රඳවා තබාගෙන සිටියේය. ජෝෂප් ස්ටාලින් අත්අඩංගුවට ගෙන නීතිවිරෝධීව රඳවා තබාගෙන සිටියදී වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ එවකට පාර්ලිමේන්තුව අමතමින් ප්‍රකාශ කළේ වෘත්තීය සමිති නායකයකු වන ජෝෂප් ස්ටාලින් අත්අඩංගුවට ගැනීම නිසා මෙරටට ලැබෙන ජීඑස්පී සහනය පවා නතර විය හැකි බවයි.

මෙසේ දිගින්-දිගටම උද්සෝෂණ මර්දනය කරමින් භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස හීන කිරීමට උත්සාහ කළ ආණ්ඩුව විසින් සමාජ මාධ්‍ය ඔස්සේ අදහස් පළ කළ සැලකිය යුතු පිරිසක් ද අත්අඩංගුවට ගනු ලැබීය. විරුද්ධ මත දරන්නන් සහ ආණ්ඩුවට එරෙහිව සමාජ මාධ්‍යවල සටහන් තබන පිරිස් මෙන්ම පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයේ නියම සැකකරුවන් වෙනුවට ව්‍යාජ චෝදනා මත විශාල පිරිසක් අත්අඩංගුවට ගැනීම ද කැපීපෙනිණි. නීතිඥ හිජාස් හිස්බුල්ලා, රම්සි රාසික්, අහ්නෆ් ජසීම් ඊට උදාහරණ කිහිපයක් පමණි.

පොලිස් අත්අඩංගුවේ සිටි ටිංකරින් ලසන්ත, මාකඳුරේ මධූෂ් වැනි සැකකරුවන් රැසක් ඝාතනය කිරීම ද මෙම කාල වකවානුවේ සිදු කළ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් අතර ඉදිරියෙන් ම තිබේ. ඇතැම් සැකකරුවන් ඝාතනය කරනු ලැබුවේ, පොලිසිය විසින් ඔවුන් ඝාතනය කිරීමේ සැලසුමක් ඇතැයි පොලිස්පතිවරයා සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කර තිබියදී ය.

## 2022 මාර්තු 31 සිට 2022 ජූලි 13 දක්වා රාජ්‍ය මර්දනය

- මිරිහානේ සාමකාමී විරෝධයට පහර දී විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීම.

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ අත්තනෝමතික ක්‍රියාකලාපයට විරෝධය පළකරමින් රට පුරා පැවති විරෝධතා රැල්ලේ සන්ධිස්ථානයක් වූයේ මාර්තු 31දා නුගේගොඩ - මිරිහානේ පිහිටි හිටපු ජනාධිපතිවරයාගේ නිවස අසල පැවති විරෝධතාවයයි. ගෝඨාභය රාජපක්ෂට ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස්වන ලෙස බලකරමින් පැවැති මෙම සාමකාමී විරෝධතාවයට ආණ්ඩුවෙන් කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කළ අතර, පසුව හමුදාව යොදවා පහර දී වෙඩි තැබීය. පොලිස්පතිවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යවන ලද බුද්ධි වාර්තාවක සඳහන් වූයේ හමුදාව කළ වෙඩි තැබීමෙන් දෙදෙනෙකුට තුවාල සිදුවී තිබූ බවයි. හමුදාව අතුරු පාරවල්වලට උද්ඝෝෂකයන් ඇගෙන ගොස් ඔවුන්ට අමානුෂික ලෙස පහරදී තිබිණි.

මෙම සාමකාමී විරෝධතාවය, ප්‍රචණ්ඩ විරෝධතාවයක් බව පෙන්වීමට සැලසුම්සහගත පිරිසක් වාහන ගිනි තැබීම් සිදු කළ අතර, එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කළ පිරිස වෙනුවට සාමකාමී විරෝධතාකරුවන් සහ සිද්ධිය ආවරණය කිරීමට ගිය මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගැනීමට පොලිසිය කටයුතු කළේය. 2022 අප්‍රේල් 01දා අලුයම 5 වන විට මේ සිද්ධියට අදාළ ව අත්අඩංගුවට ගත් ගණන 54 කි.

අත්අඩංගුවට ගත් පිරිස මිරිහාන පොලිසියේ අපරාධ විමර්ශන අංශයට ගෙන ගොස් පහර දෙන බවට ලද තොරතුරක් අනුව, තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය අලුයම 4 -5 අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහ පොලිස් මූලස්ථානයට ඒ බව දැනුම් දී අත්අඩංගුවට ගත් පිරිසගේ ආරක්ෂාව තහවුරු කරන ලෙස ඉල්ලා සිටියේය. කෙසේ වෙතත් අත්අඩංගුවට පත්වූවන්ට අමානුෂික ලෙස පහර දී තිබූ අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පොලිසියට පැමිණෙන තුරු ඔවුන් රෝහල්ගත කිරීම පවා පැහැර හැර තිබිණි. පහර කෑ පිරිස අතර ජනමාධ්‍යවේදීහු ද සිටියහ.

මෙම පිරිස ප්‍රචණ්ඩකාරීව හැසිරුණු බව තහවුරු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි පොලිසියට නොවූ බව අප්‍රේල් 01දා නුගේගොඩ - ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේදී ද හෙළිදරව් විය. පිරිසට ඇප නියම කරමින් මහේස්ත්‍රාත්වරයා ප්‍රකාශ කළේ පොලිසිය සඳහන් කරන බස් ගිනි තැබීම් වැනි දෑ සිදු කළේ මෙම සැකකරුවන් බව තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නැති බවයි.

මෙම සිදුවීමේදී අත්අඩංගුවට ගත් පුද්ගලයන්ට අමානුෂික ලෙස පහරදීම සම්බන්ධයෙන් තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය මගින් පොලිස්පතිවරයාට කරන ලද පැමිණිල්ලේ අංකය Tell IGP 02/APR/2022 වේ. මේ සම්බන්ධයෙන් මේ වන තෙක් සාධාරණ විමර්ශනයක් සිදු වී නැත.

උද්ඝෝෂණයට පහර දෙමින් සිටි හමුදාවේ සහ පොලිසියේ පිරිස් අවට නිවාසවල වතුවලට පවා ඇතුළුවී නිවැසියන්ට පහරදීම් පවා වාර්තා විය.

අප්‍රේල් 01දා උදෑසන මෙම සිදුවීම වාර්තා කිරීමට එම ස්ථානයට ගිය ජනමාධ්‍යවේදීන් කිහිපදෙනෙකුට ජනාධිපති මාධ්‍ය අංශයේ අධ්‍යක්ෂවරයකු ඇතුළු කණ්ඩායමක් විසින් එය ආවරණය කිරීමට අවස්ථාව ලබාදුන්නේ නැත. මාධ්‍යවේදීන්ට මරණීය තර්ජනය කිරීම සහ රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් මිරිහාන පොලිසියට සී/අයි/බී/2 283/300 අංකයෙන් පැමිණිල්ලක් කර ඇතත් එම පැමිණිල්ල ද මේ වන තෙක් විමර්ශනය කර නැත.

මිරිහානේ විරෝධයට හේතුව සිරස මාධ්‍ය ආයතනය බැවින් එම ආයතනය සම්බන්ධයෙන් විමර්ශනයක් කරන ලෙස ඉල්ලා අප්‍රේල් 01දා අයිජීපී/පීඑම්/සීඅයිඩී/ඔයූටී/761/22 අංකයෙන් පොලිස්පති චන්දන

වික්‍රමරත්න විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති ඩබ්ලිව්. තිලකරත්න අමතමින් ලිපියක් ද යොමු කළේය.

එම ලිපියේ මෙසේ ද සඳහන් වේ.

'එම වාර්තාව අනුව හිතාමතාම මහජනතාව කුපිත කිරීමේ අරමුණෙන් සහ මහජන සාමය කඩවන පරිදි කටයුතු කිරීමට මහජනතාව පෙළඹවීමේ අරමුණෙන් හෝ රජයට එරෙහිව මහජනතාව කුපිත කිරීම සඳහා මෙම උද්ඝෝෂණය පිළිබඳ සජීවී තොරතුරු ප්‍රචාරය කිරීම සිදු කර ඇති බව හෝ එසේ විය හැකි බව හෝ දැන-දැනම එම ප්‍රචාරක කටයුතු සිදු කර ඇති බව නිරීක්ෂණය වේ. එබැවින්, ඔබ විසින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමට පියවර ගෙන, අනාවරණය වන තොරතුරු ඇතුළත් වාර්තාවක් කඩිනමින් මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බවට දන්වමි.'

එම සාමකාමී විරෝධය ප්‍රචණ්ඩ බව පෙන්වීමට යම් සැලසුමක් තිබුණු බවත්, ආණ්ඩුවට හිතවත් පිරිසක් වාහන ගිනි තැබූ බවට සැකසහිත බවත් ඡායාරූප ඉදිරිපත් කරමින් අප්‍රේල් 01දා නුගේගොඩ - ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයට නීතිඥවරු කරුණු දැක්වූහ. එම ස්ථානයට හමුදා වාහනයක් ගෙන ආ (ගිනි තැබූ බස් රථය) පුද්ගලයා ආණ්ඩුවට හිතවත් පුද්ගලයෙකු බව මැයි 09දා අනාවරණය විය. ඔහු ගෝඨාගෝගම අරගලයට පහරදීමට අරලියගහ මැදුරේ සිට පැමිණි පිරිස අතර සිටියේය.

- අනුරුද්ධ බණ්ඩාර අත්අඩංගුවට ගැනීම

මිරිහානේ උද්ඝෝෂණය මර්දනය කිරීමට ආණ්ඩුව ගත් උත්සාහයට සහ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවේ ක්‍රියාකලාපයට එරෙහිව අප්‍රේල් 03දා රට පුරා සෑම නගරයකම උද්ඝෝෂණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට නියමිතව තිබිණි. එම උද්ඝෝෂණයේ මහනුවර ක්‍රියාකාරිකයෙකු වූ තිසර අනුරුද්ධ බණ්ඩාර නම් තරුණයා මෝදර පොලිසියේ යැයි හඳුන්වා දුන් පිරිසක් විසින් අප්‍රේල් 01දා මධ්‍යම රාත්‍රියේ ගම්පොළදී පැහැරගෙන යනු ලැබීය.

අප්‍රේල් 02දා දහවල් වන තෙක් ඔහු රඳවාගෙන සිටින ස්ථානයක් පිළිබඳ කිසිම තොරතුරක් නොතිබිණි. මෝදර පොලිසිය එවැනි අත්අඩංගුවට ගැනීමක් නොකළ බව පැවසීය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කිරීමෙන් පසු, එදින රාත්‍රී කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට අනුරුද්ධ බණ්ඩාර ඉදිරිපත් කිරීමට පොලිසිය පියවර ගත්තේය. ගම්පොළදී පොලිස් භාරයට ගැනීමෙන් පසු ඔහු මෝදර පොලිසියට අවස්ථා 2කදීත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත්, කොළඹ වෙනත් ස්ථානයකට සහ ගම්පොළ ප්‍රදේශයටත් රැගෙන ගොස් තිබිණි. තිසර අනුරුද්ධ බණ්ඩාරට එල්ල වූ චෝදනාව වූයේ ආණ්ඩුවට එරෙහිව උද්ඝෝෂණ සංවිධානය කිරීමයි.

- හදිසි නීතිය, ඇඳිරි නීතිය සහ සමාජ මාධ්‍ය තහනම

අප්‍රේල් 03දා ජනාධිපතිවරයාට සහ ආණ්ඩුවට විරෝධය පළකරමින් රට පුරා පැවැත්වීමට නියමිතව තිබූ උද්ඝෝෂණ නතර කිරීමට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව රට තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කළේය. ඉන් අනතුරුව ඇඳිරි නීතිය පනවා, ජනතාවගේ යෑමට-ඒමට ඇති අයිතිය මෙන්ම සාමකාමීව රැස්වීමට ඇති අයිතිය ද නැති කිරීමට පියවර ගත්තේය.

ආණ්ඩුවේ නීතිවිරෝධී ඇඳිරි නීතිය සහ හදිසි නීතිය නොතකා පුරවැසියෝ පාරට පැමිණ විරෝධතා දක්වන්නට වූහ. එම නිසා සමාජ මාධ්‍ය ද අවහිර කිරීමට විදුලි සංදේශ නියාමන කොමිසම හරහා දුරකතන සේවා සමාගම්වලට නීතිවිරෝධී නියෝග ලබාදෙමින්, ආණ්ඩුව භාෂණයේ ප්‍රකාශනයේ අයිතිය ඇතුළු මූලික අයිතිවාසිකම් කඩකරමින් මර්දනය දියත් කළේය.

- උද්ඝෝෂකයන් ලෙස හමුදාව යෙදවීමේ උත්සාහය

අප්‍රේල් 15දා උද්ඝෝෂකයන් ලෙස සටන් පාඨ කියමින් පුහුණු වන හමුදා කණ්ඩායමක වීඩියෝවක් සමාජ මාධ්‍ය හරහා සංසරණය විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඒ ගැන සොයාබැලීමට ගනේමුල්ලේ පිහිටි අදාළ හමුදා කඳවුරට ගිය විට, ඔවුන් දැනුම් දී තිබුණේ සාමාන්‍ය හමුදා පුහුණුවලදී එවැනි ක්‍රියාකාරකම් කරන බවත්, මෙය ද සාමාන්‍ය හමුදා පුහුණුවක් බවත් ය. කෙසේ වෙතත් මෙය උද්ඝෝෂකයන් ලෙස හමුදාවේ පිරිස් යොදවා කඩාකප්පල්කාරී ක්‍රියාවක් කිරීමේ සැලසුමක් බවට දේශපාලන පක්ෂවලින් සහ සිවිල් සංවිධානවලින් චෝදනා එල්ල විය.

- අප්‍රේල් 16දා වැල්ලවත්ත පොලිස් බල ප්‍රදේශයේදී ආණ්ඩුවට එරෙහිව සටන් පාඨ කී තරුණයන් තිදෙනෙකු වැල්ලවත්ත පොලිසියට රැගෙන ගොස් පහර දී පසුව අත්හැර තිබිණි.

- අප්‍රේල් 17දා ගාල්ල, ගෝඨාගෝගම කඩා ඉවත් කර එහි තිබූ ටෙන්ට් පොලිසිය විසින් රැගෙන යන ලදි. පසුව නීතිඥවරුන් මැදිහත් වී ඒ ගැන ප්‍රශ්න කිරීමෙන් පසු ගලවාගෙන ගිය ටෙන්ට් රෙදි මුදා හැරිණි.

- රඹුක්කන වෙඩි තැබීම

අප්‍රේල් 18දා රඹුක්කන සමූපකාර ඉන්ධන පිරවුම්හලට තෙල් බවුසර් 2ක් ලැබෙන බව දැනුම් දීම නිසා විශාල පිරිසක් දීර්ඝ වේලාවක සිට පිරවුම්හල ඉදිරිපිට පෝලිමේ සිටියහ. කෙසේ වෙතත් ලැබෙන බව කී ඉන්ධන බවුසරය ප්‍රමාද කිරීමත්, එලෙස ප්‍රමාධ කර පසුදින ඉන්ධන මිල වැඩිවූ පසුව ලබාදීමත්, එම බවුසරයේ ප්‍රමාණවත් ඉන්ධන නොතිබෙන බව දැනුම්දීමත් නිසා ඉන්ධන ඉල්ලමින් රඹුක්කනදී සාමකාමී විරෝධතාවක් පැවැත්විණි.

අප්‍රේල් 19දා දහවල් වන විට උද්ඝෝෂණයට විශාල පිරිසක් එක්ව සිටියහ. දේශපාලන අධිකාරියේ ඉල්ලීම මත පොලිස්පතිවරයා විසින් නීතිය හා මහජන සාමය අමාත්‍යාංශ ලේකම්වරයාට උද්ඝෝෂණය විසිරුවා හැරීමට සිදු වන බව දැනුම්දීමෙන් පසු, කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු ඇතුළු කණ්ඩායමක් උද්ඝෝෂණය විසිරුවා හැරීමට කටයුතු කළේය.

ඒ අතරතුරදී පොලිසිය විසින් නිරායුධ සිවිල් වැසියන්ට කළ වෙඩි තැබීමෙන් පුද්ගලයෙකු මියගොස්, තවත් 20 දෙනකුට අධික පිරිසක් තුවාල ලැබීය. පොලිසිය අමානුෂික ලෙස සාමකාමී විරෝධතාකරුවන්ට මෙන්ම මංමාවත්වල යමින් සිටි සාමාන්‍ය ජනතාවට ද පන්න-පන්නා පහර දී, වෙඩි තබා තිබිණි. වෙඩි වැදීමෙන් පාසල් සිසුවකු ද බරපතළ තුවාල ලැබීය.

එම ස්ථානයේ තිබූ ත්‍රීරෝද රථයකට ගිනි තබා යතුරු පැදි පෙරළා අලාබ හානි කර තිබිණි. කලහකාරීන් ත්‍රීරෝද රථය ගිනි තැබූ නිසා තෙල් බවුසරයටත් ගිනි තබාවි යැයි මතු වූ සැකය මත එය බේරා ගැනීමට උද්ඝෝෂණය විසිරුවා හැරි බව පොලිසිය කීවේය. කෙසේ වෙතත් කෑගල්ල මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ සාක්ෂි ලබාදෙමින් තරුණයෙකු සඳහන් කළේ පොලිසිය තමන්ගේ ත්‍රීරෝද රථයට ගිනි තබනු තමන් දුටු බවයි. එනම් වෙඩි තැබීම සාධාරණීකරණය කිරීමට පොලිසිය විසින් ම ගිනි තැබීම් ආදිය සිදු කර ඇති බව පැහැදිලි ය. එම ස්ථානයේ තිබූ යතුරුපැදි පොලිසිය විසින් ම පෙරළන වීඩියෝ ද සමාජ මාධ්‍යවල සංසරණය විය. මිරිහානේ මෙන්ම ප්‍රචණ්ඩත්වය ඇති කිරීම සඳහා ආරක්ෂක අංශ සැලසුම් සහගතව රඹුක්කනදී ද ක්‍රියාකර තිබිණි.

- විරෝධතාකරුවන් ඝාතනය කිරීමට උත්සාහ දැරීම

අප්‍රේල් 23දා පොලිසිය විසින් වාහනයකට යට කර, අරලියගහ මැදුර අසල පිහිටා තිබූ මයිනාගෝගම විරෝධතාවයේ සිටි පිරිස් ඝාතනය කිරීමට උත්සාහ කළේය. මේ සම්බන්ධයෙන් CIB/i/333/116 අංකයෙන් කොල්ලුපිටිය පොලිසියට පැමිණිලි කර තිබේ. එම පැමිණිල්ලට අදාළව ද සාධාරණ විමර්ශනයක් සිදු වූයේ නැත.

මයිනාගෝගම විරෝධතාකරුවන්ට බාධා වන අයුරින් අරලියගහ මැදුරේ අධික ශබ්දයෙන් පිරිත් දමා තිබූ අතර, එම නිසා ප්‍රදේශවාසීන්ට ද බාධා එල්ල විය. අධික ශබ්දය නතර කිරීමට මැදිහත් වන ලෙස විරෝධතාකරුවන් පොලිසියෙන් ඉල්ලීම් කළත්, පොලිසිය ඒ සඳහා මැදිහත්වීමක් කළේ නැත. ඊට විරුද්ධව ප්‍රදේශවාසීන් පිරිසක් අධිකරණ ක්‍රියාමාර්ගයකට යෑමට තීරණය කළහ. ඒ සඳහා ප්‍රදේශවාසීන්ගෙන් අත්සන් එකතු කරද්දී එම අධික ශබ්දය නතර කිරීමට පියවර ගෙන තිබිණි.

- මාර්ග අවහිර කිරීම සහ මාරාන්තික මාර්ග බාධක යෙදීම

අප්‍රේල් 24දා අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ විරෝධතාවක් පැවැත්වීමට නියමිතව තිබියදී, අප්‍රේල් 23දා පොලිසිය මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර, කොළඹ-කොටුවේ මංමාවත් කිහිපයකට එම උද්ඝෝෂකයන් ඇතුළු වීම වළක්වමින් අධිකරණ නියෝග ඉල්ලා සිටියේය. අධිකරණ නියෝගය ලබාදෙමින් මහේස්ත්‍රාත්වරයා පැහැදිලිව සඳහන් කළේ අදාළ මංමාවත්වල යන සාමාන්‍ය පුරවැසියන්ට සහ ගාලුමුවදොර අරගලයේ සිටින පිරිසට කෑම-බීම ආදිය රැගෙන යන පිරිසට පොලිසිය ඉඩ දිය යුතු බවයි.

කෙසේ වෙතත් පොලිසිය එම අධිකරණ නියෝගය පෙන්වමින් කිසිම පුද්ගලයෙකුට යෑමට-ඒමට අවස්ථාව නැති වන පරිදි ප්‍රධාන මාර්ග කිහිපයක් සම්පූර්ණයෙන් ම වසා දැමීය. ඒ හරහා යෑමට ජනතාවට මෙන්ම ගිලන් රථවලට ද ඉඩ ලබාදුන්නේ නැත. ඇතැම් මාර්ග බාධකවලට උල් කටු සවි කර, ඒවා මතින් ඉටි කොළ දමා තිබූ අතර, මාර්ග බාධකවලට තෙරපෙන පුද්ගලයන්ට එම යකඩ උල් ඇනීමට සලස්වා ඝාතනය කිරීමේ සැලසුමක් තිබූ බව කියමින් කොළම - කොටුව පොලිසියට CIB/1/15/159 අංකයෙන් පැමිණිල්ලක් සහ ඊ-මේල් මගින් වැඩිදුර කරුණු දැක්වීමක් ඉදිරිපත් කර ඇතත්, කිසිදු විමර්ශනයක් පැවැත්වූයේ නැත.

- මැයි 04දා ගාලුමුවදොර ගෝඨාගෝගම සාමකාමී අරගලයට සක්‍රීය ව සම්බන්ධ වී සිටි සමන් කුමාර රත්නතිලක ව්‍යාජ චෝදනා මත යක්කල පොලිසියෙන් අත්අඩංගුවට ගෙන අමානුෂික ලෙස පහර දී තිබිණි. එම පහරදීම සම්බන්ධයෙන් යක්කල පොලිසියට ම CIB/ii/64/167 අංකයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ.

- විරෝධතාකරුවන් 13 දෙනෙකු අත්අඩංගුවට ගැනීම

මැයි 04දා කතානායක මහින්ද යාපා අබේවර්ධනට ලිපියක් බාරදීමට දහතුන් දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් (ඔවුහු සාමකාමී අරගලකරුවෝ වූහ.) ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු සංකීර්ණයේ පිවිසුම අසලට ගියහ. කතානායකවරයාගේ නියෝජිතයෙකු පැමිණ එම ලිපිය බාරගත්තේය. ලිපිය බාර දී යළි ආපසු එමින් සිටියදී, පොලිසිය ඔවුන් අත්අඩංගුවට ගෙන මහරගම පොලිස් ස්ථානයට රැගෙන ගියේය.

කලහකාරී ලෙස හැසිරීම ඇතුළු චෝදනා කිහිපයක් එල්ල කරමින් එදින පස්වරු 6ට පමණ ඔවුන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ පොලිසිය, පිරිස රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස ඉල්ලා සිටියේය. කෙසේ වෙතත් ඔවුන් වෙනුවෙන් ජනාධිපති නීතිඥවරු ප්‍රමුඛ නීතිඥවරු කණ්ඩායමක් පෙනී සිට කරුණු දැක්වූහ. පසුව ඔවුන් ඇප මත මුදා හැරිණි.

- හර්තාල්වලින් පසු හදිසි නීතිය

මැයි 06 දා වෘත්තීය සමිති සහ බහුජන සංවිධානවල මෙහෙයවීමෙන් රට පුරා හර්තාල් ව්‍යාපාරයක් පැවැත්විණි. ආණ්ඩුවට එරෙහිව පැවැති එම හර්තාල් ව්‍යාපාරය ඉතා සාර්ථක වූ අතර, හම්බන්තොට, කුරුණෑගල, ගම්පහ වැනි පසුගිය ජනාධිපතිවරණයේදී සහ පාර්ලිමේන්තු මැතිවරණයේදී ආණ්ඩුව උපරිම ඡන්ද ප්‍රමාණයක් ලබාගත් දිස්ත්‍රික්කවල පවා සියලු කඩ සාප්පු වසා දමා තිබිණි.

එම හර්තාල් ව්‍යාපාරයෙන් පසු තවදුරටත් එවැනි ක්‍රියාමාර්ග ගැනීම නතර කිරීම සඳහා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් යළිත් වරක් මැයි 06 දා රට තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කළේය.

- ගෝඨාගෝගම සහ මයිනාගෝගම සාමකාමී අරගලයට ප්‍රහාරයක් එල්ල කිරීම

මැයි 09දා අරලියගහ මන්දිරයට පිරිසක් කැඳවා, ඔවුන් මගින් ගෝඨාගෝගම සාමකාමී අරගලකරුවන්ට පොලු මුගුරුවලින් සහ අතින් පයින් පහර දී කිහිපදෙනෙකු ඝාතනය කිරීමට ආණ්ඩුව උත්සාහ කළේය. එවැනි පහරදීමක් ගැන කලින් තොරතුරු වාර්තා වී තිබියදී මෙම පිරිස අරලියගහ මැඳුරේ සිට ගෝඨාගෝගමට පැමිණීම නතර කිරීමට එම ස්ථානයේ රාජකාරි කළ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ප්‍රමුඛ පොලිස් නිලධාරීන් කටයුතු කළේ නැත. මේ සම්බන්ධයෙන් දේශබන්දු තෙන්නකෝන්ට එරෙහිව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට නීතිපතිවරයා පවා දැනුම් දී තිබියදීත්, ඔහු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළේ නැත. සිද්ධිය සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ ඇතුළු දේශපාලනඥයන් කිහිපදෙනෙකු ම අත්අඩංගුවට ගත යුතු ව තිබුණද, මේ වන තෙක් ඔවුන් අත්අඩංගුවට ගැනීමක් සිදු වූයේ නැත.

- මැයි 10දා බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ට පහර දුන්නේ යැයි සැකපිට තිදෙනෙකු අත්අඩංගුවට ගෙන, පහර දී තිබිණි. ඔවුහු අගෝස්තු 05දා තෙක් රක්ෂිත බන්ධනාගාරගත ව සිට පසුව ඇප ලැබූහ. ඔවුන්ට පහර දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම දැනුවත් කර තිබේ.

- විරෝධතාකරුවන් 3,522ක් අත්අඩංගුවට ගැනීම

මැයි 09දා ගෝඨාගෝගමට සහ මයිනාගෝගමට පහරදීමෙන් පසු, එදින සහ පසු දින රට පුරා සිදුවීම් රැසක් වාර්තා විය. මැති-ඇමැතිවරුන්ගේ නිවාස ගිනි තැබීම් ඇතුළු එම සිදුවීම්වලටට බව කියමින් අගෝස්තු 22 වන විට පුද්ගලයන් 3,522ක් අත්අඩංගුවට ගෙන තිබිණි. ඒ අතරින් පුද්ගලයන් 1,249ක් රක්ෂිත බන්ධනාගාරගත කර තිබිණි. මෙම සිදුවීම් දාමය සිදු වන තෙක් පොලිසිය ඔවුන් නතර කිරීමට පියවර ගත්තේ නැත. ශ්‍රී ලංකාවේ පොලිස් ස්ථාන අතරින් බහුතරයක සිටින්නේ දේශපාලන අවශ්‍යතා මත පත්කළ නුසුදුසු ස්ථානාධිපතිවරුන් බව පොලිස්පතිවරයා විසින් යවන ලද ලිපියක පවා සඳහන් විය. දේශපාලන හිතවත්කම් මත පත්වූ ස්ථානාධිපතිවරුන් සහ අනෙකුත් පොලිස් නිලධාරීන් තමන්ගේ හිතවත් දේශපාලනඥයාගේ නිවසට අලාබහානි කරන තෙක් නීතිය ක්‍රියාත්මක නොකිරීමෙන් ම මෙය ආරක්ෂක

අංශවල ද සහායෙන් සැලසුම් සහගත පිරිසක් සිදු කරන ලද්දක් බවට බරපතළ සැකයක් මතු විය. මේ සිදුවීම් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් බොහෝදෙනෙක් ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධ වූවෝ නොවෙති. අත්අඩංගුවට ගත් පිරිස අතර පාසල් සිසුහු ද වෙති. අත්අඩංගුවට ගත් ඇතැම් සැකකරුවන්ට පහර දී තිබූ බව වාර්තා විය.

- මැයි 13දා කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටි ආයතනයක සේවය කළ ප්‍රබෝධ මධුෂාන් ඇඳිරි නීතිය උල්ලංඝනය කළ බව කියමින් අත්අඩංගුවට ගනු ලැබ, දින 21ක් රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

- මැයි 16 දා ආරුමුගම් බාලසුබ්‍රමනියම් නම් තරුණ සේවා නිලධාරියෙකු රාජ්‍ය මර්දනය විවේචනය කිරීම හේතුවෙන් අත්අඩංගුවට ගත් අතර, ඔහුට ඇප ලැබුණේ මැයි 19 දා ය.

- මැයි 16දා ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සම්බන්ධ වී යැයි සුසන්ත රඹුක්වැල්ල නම් කන්තලේ මහවැලි මහා විද්‍යාලයේ පුස්තකාල සහකාරවරයෙකු කන්තලේ පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබීය.

- මැයි 16දා කුරුණෑගල ගෝඨාගෝගම අරගලකරුවෙකු වූ වාරියපොළ අමිල මෙන්ඩිස් පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබීය.

- වැකඳවල රාහුල හිමි අත්අඩංගුවට ගැනීම

මැයි 26දා, ශ්‍රී ලංකාවේ ප්‍රකට පරිසරවේදියෙකු සහ වීරකැටිය ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරස්ථ සොබාදහම් පාසලේ ප්‍රධානියා ද වන වැකඳවල රාහුල හිමි සහ දේවාලේගම ප්‍රේමරතන හිමි ව්‍යාජ චෝදනා මත අත්අඩංගුවට ගනු ලැබීය.

මැයි 09දා වීරකැටියේ - මැදමුලන ඩී.ඒ. රාජපක්ෂ ස්මාරකයට හානි කිරීම ඇතුළු සිදුවීම් 07කට අදාළ නඩු 07කට ඒ හිමිවරුන් අධිකරණයට ඉදිරිපත් කෙරිණි. මැයි 31 දක්වා ඒ හිමිවරුන් රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබීය. අදාළ සිදුවීම් වූ දිනයේ රාහුල හිමියන් මාතර ගෝඨාගෝගම සිටි බවට සහ අනතුරුව මාතර මාලිම්බඩ විහාරස්ථානයේ සිටි බවට සාක්ෂි තිබියදී ව්‍යාජ චෝදනා මත වීරකැටිය පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සංගීත් නමැති නිලධාරියාගේ මෙහෙයවීමෙන් ඒ හිමියන් අත්අඩංගුවට ගනු ලැබීය. රාහුල හිමියන්ට ඇප ලැබුණේ මැයි 31දා ය. ඒ හිමියන්ගේ නඩුව පැවැති මැයි 31දා එය ආවරණය කිරීමට ගිය ජනමාධ්‍යවේදීන්ට වීරකැටිය පොලිස් ස්ථානාධිපතිවරයා බාධා කළ අතර, ඉහළ පොලිස් නිලධාරීන්ට පැමිණිලි කිරීමෙන් අනතුරුව නඩුව ආවරණය කිරීමට අවසර ලැබිණි.

- රතිඳු සේනාරත්න අත්අඩංගුවට ගැනීම සහ තවත් පිරිසක් සැකකරුවන් කිරීම

මැයි 30දා කොම්පඤ්ඤවීදිය පොලිසිය මගින් රතිඳු සුරම්‍ය සේනාරත්න හෙවත් රැට්ටා අත්අඩංගුවට ගනු ලැබීය. ඔහු සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු මෙන්ම ගෝඨාගෝගම අරගල භූමියේ කැපී පෙනෙන

සාමාජිකයෙකු ද විය. ගෝඨාගෝගමට පහරදීම සම්බන්ධ නඩුව මැයි 25දා කොළඹ - කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී කැඳවනු ලැබූ අතර, එදින අධිකරණය ඉදිරිපිට සාමකාමී විරෝධතාවක් පැවැත්විණි.

එම සාමකාමී විරෝධතාවට සහභාගි වූ රතිඳු හෙවත් රැට්ටා මාර්ග අවහිර කරමින්, බාධා කරමින් හැසිරුණේ නැත. උදෑසන 9.30 පමණ වන තෙක් එහි රැඳී සිට ඔහු පිටව ගියේය. එම ස්ථානයේ සිටි පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කළ බව කියමින් පොලිසිය ඔහු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඇප ලැබිණි.

රතිඳු අත්අඩංගුවට ගත් අවස්ථාවේ ඔහු බැලීමට පොලිසියට ගිය නීතිඥවරුන්ට පොලිසිය දැනුම් දී තිබුණේ වෘත්තීය සමිති නායකයන්, ආගමික නායකයන් ඇතුළු 08 දෙනෙකු එම සිදුවීමට අදාළ ව සැකකරුවන් කර ඇති බවයි.

තැන්නේ ඥානානන්ද හිමි, ටැම්පිටියේ සුගතානන්ද හිමි, සත්‍යවේල් පියතුමා, ජෝෂප් ස්ටාලින්, ජගත් මනුවර්ණ, ධම්මික මුණසිංහ, දමිතා අබේරත්න, රතිඳු හෙවත් රැට්ටා එම පිරිස වේ. ජගත් මනුවර්ණ එදින අධිකරණය අසලට පැමිණියේ පොලිසියේ දැනුම් දීම මත ය. මෙහි නම් සඳහන් හිමිවරුන් සහ පියතුමා පාර අයිනට වී, විරෝධතා පුවරු අතැතිව සිටියහ. ජෝෂප් ස්ටාලින් සහ ධම්මික මුණසිංහ ද විරෝධතා පුවරු අතැතිව පාර අයිනේ සිටි අතර, ඔවුන් පොලිසියට හෝ වෙනත් අයෙකුට බාධා කළේ නැත. එසේ තිබියදී පොලිසිය ඔවුන්ට එරෙහිව ව්‍යාජ චෝදනා ඉදිරිපත් කර තිබේ.

- ව්‍යාජ තොරතුරු සහිත පොලිස් නිවේදනය

ජුනි 17දා පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් අරගලයේ ක්‍රියාකාරිකයන් නවදෙනෙකු අත්අඩංගුවට ගැනීම සඳහා නියෝග නිකුත් කර ඇතැයි සඳහන් කළේය. එම පිරිස වූයේ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ, වෙනසක තාරුණ්‍යය සංවිධානයේ ජාතික සංවිධායක ලහිරු වීරසේකර, රංගන ශිල්පි ජගත් මනුවර්ණ, කලාකරු ජෙහාන් අප්පුහාමි, සිවිල් ක්‍රියාකාරික ධම්මික මුණසිංහ, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, ශිෂ්‍ය ක්‍රියාකාරික රත්කරව්වේ ජිනරතන හිමි සහ ක්‍රියාකාරික ගල්වැව සිරිධම්ම හිමියන් ය.

ජුනි 09දා ඔවුන් සාමකාමී විරෝධතාවක් පැවැත්වීම මත පොලිසිය ඔවුන්ට එරෙහිව අධිකරණයට කරුණු වාර්තා කර තිබිණි.

ඔවුන් අත්අඩංගුවට ගැනීමට නියෝග ලබාදී ඇති බවට පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා නිකුත් කළ නිවේදනය අසත්‍යයකි. ඊට අදාළ නඩු පොත පරීක්ෂා කිරීමේදී පෙනී ගියේ අදාළ දිනයේ එම නඩුව සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් එවැනි නියෝගයක් නිකුත් කර නොමැති බවයි. එම නඩුවට අදාළ ව ඒ වන විට නිකුත් කර තිබූ එක ම නියෝගය වූයේ රූපවාහිනී දර්ශන ලබාගැනීමේ නියෝගයක් පමණි. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ව්‍යාජ තොරතුරු සහිතව මාධ්‍ය නිවේදන නිකුත් කරමින් ජනතාව අතර අරගලකරුවන් ගැන වැරදි චිත්‍රයක් ඇති කරන ආකාරයටත්, අරගලකරුවන්ට මානසික පීඩනයක් ඇති කරවීමේ අදහසිනුත් කටයුතු කර තිබිණි.

මෙම නම් සඳහන් පිරිස අතරින් අටදෙනෙකු ජුනි 22දා කොළඹ - කොටුව පොලිස් ස්ථානයට ගියේ බාරවන්නට ය. කොටුව පොලිස් බල ප්‍රදේශයේ සිදුවීයැයි කියන සිදුවීමක් සම්බන්ධයෙන්, කොටුව පොලිස් ස්ථානයෙන් අධිකරණයට කරුණු වාර්තා කර තිබියදී මෙම පිරිස බාරගැනීම කොටුව පොලිසිය ප්‍රතික්ෂේප කළ අතර, ඔවුන්ට මරදාන පොලිසියට යන ලෙස දැනුම් දෙනු ලැබීය.

ඒ අනුව මරදාන පොලිසියට ගිය මෙම පිරිසගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඔවුන් අත්අඩංගුවට ගෙන අධිකරණට ඉදිරිපත් කිරීමෙන් පසු, මහේස්ත්‍රාත්වරයා විසින් ජූලි පළමු වැනිදා තෙක් රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. පසුව ජුනි 24දා අධිකරණයට මෝසමක් ඉදිරිපත් කිරීමෙන් පසු ජගත් මනුවර්ණ,

ජෙහාන් අප්පුහාමි, ධම්මික මුණසිංහ සහ එරංග ගුණසේකර යන සිව්දෙනාට ඇප නියම කෙරිණි. රතිඳු සේනාරත්න, රත්කරව්වේ ජිනරතන හිමි සහ ලහිරු වීරසේකර යන පිරිසට ජූලි 01දා ඇප නියම විය.

සමාජ මාධ්‍යවල කළ පළකිරීමක් සම්බන්ධයෙන් ජූනි 16දා ගාල්ල - නාගොඩ ප්‍රදේශයේ පුද්ගලයෙකු අත්අඩංගුවට ගනු ලැබීය.

පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කළ බව කියමින් පොලිසිය ජූනි 17දා විශ්වවිද්‍යාල සිසුන් තිදෙනෙකු අත්අඩංගුවට ගනු ලැබීය. පොලිසිය ඔවුන් අත්අඩංගුවට ගෙන තිබුණේ ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර දෙවැනි එක් දින ක්‍රිකට් තරගාවලිය පැවති මහනුවර පල්ලෙකැලේදී ය.

ආණ්ඩුවට විරුද්ධව අදහසක් පළ කළේ යැයි කියමින් ඒ.එම්. කුමාර අන්දරගේ නම් ගුරුවරයෙකු බදුල්ල පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ මැයි 17දා මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පමුණුවනු ලැබීමෙන් පසු ඇප නියම විය. කෙසේ වෙතත් ඔහුගේ සේවය අත්හිටුවිණි.

- විරෝධතාකරුවන් 21ක් අත්අඩංගුවට

ජූනි 20දාට යෙදී තිබුණු ගෝඨාභය රාජපක්ෂගේ උපන් දිනය නිමිත්තෙන්, ඔහුට ජනාධිපති ධුරයෙන් ඉවත් වන ලෙස බලකරමින් ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට සාමකාමීව විරෝධය පළකිරීම සම්බන්ධයෙන් එදින උදෑසන පොලිසිය විසින් 21 දෙනෙකු අත්අඩංගුවට ගනු ලැබිණි. පොලිසිය එම ස්ථානයට කඩා වැදී විරෝධතාකරුවන්ට පහර දී අත්අඩංගුවට ගන්නා ආකාරය සමාජ මාධ්‍ය ඔස්සේ සජීවී ව විකාශය කරමින් සිටි අනුරුද්ධ බණ්ඩාර නම් සමාජ ක්‍රියාකාරිකයා සහ තවත් පුද්ගලයෙකු ද මෙහිදී අත්අඩංගුවට ගනු ලැබිණි. අත්අඩංගුවට ගත් පිරිස කොළඹ දිසාවෙන් පිට පැලියගොඩ පොලිසියට රැගෙන ගොස් ප්‍රකාශ සටහන් කර ගනු ලැබීය.

ඔවුන් ජනාධිපතිවරයාට විරෝධය පළකරමින්, ඔහුගේ උපන් දිනය නිමිත්තෙන් මෙම විරෝධය පැවැත්වුවද, පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කරමින් ප්‍රකාශ කළේ විරෝධතාකරුවන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකාව අතර මුදල් අමාත්‍යංශයේ පැවැති සාකච්ඡාව කඩාකප්පල් කිරීමට දොරටු අවහිර කරගෙන විරෝධතා පැවැත්වූ බවයි. විරෝධතාකරුවන් සාමකාමීව විරෝධය දැක්වීම සහ එසේ දැක්වීමට හේතුව නීතිඥවරුන් අධිකරණයට කරුණු දක්වමින් ප්‍රකාශ කළ අතර, පොලිසිය ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින් මෙම පිරිස රක්ෂිත බන්ධනාගාරගත කරවීමට උත්සාහ ගන්නා ආකාරය පැහැදිලි කරන ලදි. අනතුරුව කොළඹ - කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඔවුන්ට ඇප නියම විය.

මෙම පිරිස අතර සිටි දානිෂ් අලි නම් විරෝධතාකරුගෙන් වෙනම ම ප්‍රශ්න කර, ඔහු තවත් නඩුවකට අදාළ බව කියමින් රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස පොලිසිය අධිකරණයෙන් ඉල්ලා සිටියේය. කොළඹ, කොටුවේ ජූනි 09දා පැවැති විරෝධතාවයේදී පොදු දේපොළවලට රුපියල් 67,000ක අනර්ථයක් කළ බව සඳහන් කරමින් හඳුනාගැනීමේ පෙරට්ටුවකට ඉදිරිපත් කිරීම සඳහා ඔහු ව බන්ධනාගාරගත කරන ලෙස ඉල්ලා සිටි පොලිසිය, හඳුනාගැනීමේ පෙරට්ටුවකට ඉදිරිපත් කරන නිසා බව කියමින් ඔහු විවෘත අධිකරණයට ඉදිරිපත් කළේ ද නැත.

නීතිඥවරුන් මෙහිදී කරුණු දක්වමින් මෙම සැකකරු හඳුනාගැනීමට සිටින්නේ කොටුව පොලිසියේ නිලධාරියෙකු බවත්, කොටුව පොලිසියේ ස්ථානාධිපතිවරයා පැලියගොඩ පොලිසියට ගොස් මෙම විරෝධතාකරුගේ ඡායාරූප තම ජංගම දුරකතනයෙන් ලබාගත් බවත් ප්‍රකාශ කරන ලදි. කොටුව ස්ථානාධිපතිවරයා විවෘත අධිකරණයේදී එය පිළිගත් අතර, ඒ අනුව පෙරට්ටුව අවලංගු කර ඔහු ඇප මත මුදාහැරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

- අමල් සාලින්ද අත්අඩංගුවට ගැනීම

ගෝඨාගෝගම විරෝධතාකරුවකු වන අමල් සාලින්ද ජුනි 20 දා බස් රථයකට නගිමින් සිටියදී අත්අඩංගුවට ගනු ලැබිණි. පොලිසියේ රාජකාරියට බාධා කළ බව කියමින් අත්අඩංගුවට ගත් ඔහු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. පසුව ඔහු හමුදාවෙන් පළා ආ පුද්ගලයෙකු බව කියමින් යුද හමුදා පොලිසියේ බාරයට ගත් අතර, එම කටයුතු අවසන් වීමෙන් පසු අගෝස්තු මස මුල් සතියේදී මුදා හරිනු ලැබීය.

- මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම

තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු මෙන්ම අනිද්දා පුවත්පතේ හිටපු විශේෂාංග කර්තෘවරයෙකු ද වන සටහන් මාධ්‍ය ආයතනයේ සංස්කාරක මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර ජුනි 28දා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීය. ඔහුගේ සටහන් යූටියුබ් නාලිකාවේ ආණ්ඩුව විවේචනය කරමින් වීඩියෝ පළකරන බවට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බුද්ධි අංශය මගින් කරන ලද පැමිණිල්ලක් අනුව එසේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයක් ආරම්භ කර තිබිණි. තරිඳු උඩුවරගෙදර මාධ්‍යවේදියාගෙන් ප්‍රකාශ ලබාගැනීමෙන් පසු, පසුගිය අගෝස්තු 03දා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එම සිදුවීම සම්බන්ධයෙන් කොළඹ - කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළේය.

- ජුනි 29දා කොළඹ, චැතම් වීදියේ පැවැති විරෝධතාවක් අතරතුරදී විරෝධතාකරුවන් පස්දෙනෙකුට පහර දී අත්අඩංගුවට ගනු ලැබීය.

- හිරුණිකා ප්‍රේමචන්ද්‍ර අත්අඩංගුවට ගැනීම

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට ඉල්ලා අස්වන ලෙස බලකරමින් කොළඹ - කොටුව ජනාධිපති මන්දිරය ඉදිරිපිට සාමකාමී විරෝධතාවක නිරත වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු අටදෙනෙකු ජූලි 06දා අත්අඩංගුවට ගනු ලැබීය. පොලිස් ඇප මත මුදා හරුණු මෙම පිරිසට එරෙහිව කොළඹ - කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු අගෝස්තු 05දා අධිකරණයේ පෙනී සිටින ලෙස නොතීසි නිකුත් කර තිබිණි.

නොතීසි මත අධිකරණයේ පෙනී සිටි හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු පිරිස සම්බන්ධයෙන් පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කළ ආකාරය දෝෂ සහිත බව ඇය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් පෙන්වාදීමෙන් පසු, පොලිසියේ ඉල්ලීමට අදාළ ව ක්‍රියා නොකිරීමට මහේස්ත්‍රාත්වරයා පියවර ගත්තේය.

- ජූලි 08දා කොළඹ දී සාමකාමී විරෝධතාවක නිරත වූ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ සාමාජිකයන්ට දිගින්-දිගටම කඳුළු ගෑස් සහ මඩ වතුර ප්‍රහාර එල්ල කිරීමට පොලිසිය කටයුතු කළේය.

- ඇඳිරි නීතිය පැනවීම

ජනාධිපතිවරයාට ඉල්ලා අස්වන ලෙස බලකරමින් ජූලි 09දා කොළඹදී පැවැත්වීමට නියමිතව තිබූ දැවැන්ත විරෝධය කඩාකප්පල් කිරීමේ අරමුණින් පොලිස්පතිවරයා බස්නාහිර පළාතේ ප්‍රදේශ කිහිපයකට පොලිස් ඇඳිරි නීතිය පැනවූ බව ජූලි 08දා රාත්‍රියේ නිවේදනය කළේය. පොලිස්පතිවරයාගේ ඇඳිරි නීතිය මත කටයුතු කරන බව පවසමින් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා සියලු දුම්රිය ගමන් ද නතර කළේය.

'පොලිස් ඇඳිරි නීතියක්' නීතියේ කිසිම තැනක සඳහන් නොවන බව පෙන්වාදෙමින් වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන පොලිස්පතිවරයාට ලිඛිතව දැනුම් දීම් කළ අතර, ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද නීතිවිරෝධී පොලිස් ඇඳිරි නීතිය සම්බන්ධයෙන් නිවේදන නිකුත් කළේය.

ඒ අනුව එම නීතිවිරෝධී පොලිස් ඇඳිරි නීතිය ඉවත් කරගන්නා බව පොලිස්පතිවරයා 09දා අලුයම නිවේදනය කළේය. මෙසේ නීතිවිරෝධී ව පොලිස් ඇඳිරි නීතිය පැනවීම සම්බන්ධයෙන් මේ වන විට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර තිබේ. ඒ තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය නියෝජනය කරමින් තරිඳු ජයවර්ධන සහ තරිඳු උඩුවරගෙදර යන මාධ්‍යවේදීන් දෙදෙනා විසින් ය.

- නිරායුධ විරෝධතාකරුවන්ට පහර දී වෙඩි තැබීම

ගෝඨාභය රාජපක්ෂට ජනාධිපති ධුරයෙන් ඉවත් වන ලෙස බලකරමින් දැවැන්ත ජන සමූහයක් ජූලි 09දා කොළඹට පැමිණ විරෝධතාවයේ නිරත විය.

මෙම විරෝධතා විසුරුවා හැරීම සඳහා ආරක්ෂක අමාත්‍යංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමකින් පසු, පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව යොදවා තිබිණි. සාමකාමීව ආරම්භ වූ විරෝධතාවට ආරක්ෂක අංශ දිගින්-දිගටම කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළ අතර, කොළඹ ප්‍රධාන මාර්ග රැසක් ස්ථිර මාර්ග බාධක යොදා වසා තිබිණි. විරෝධතාකරුවන් පැති තුනකින් වට කරමින් ආරක්ෂක අංශ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළේය.

ඊට අමතරව අමානුෂික ලෙෂ ජනතාවට පහරදීම සහ වෙඩි තැබීම ද සිදු කෙරිණි. වෙඩි තැබීමෙන් පුද්ගලයෙකු තුවාල ලැබූ බව පොලිස් මූලස්ථානයේ දී පැවැති සාකච්ඡාවකදී පසුව් පොලිසිය පිළිගත්තේය.

- මාධ්‍යවේදීන්ට ප්‍රහාර

ජූලි 09දා පස්වරුවේ එවකට අගමැති රනිල් වික්‍රමසිංහගේ නිවස ඉදිරිපිට පැවැති විරෝධතාව වාර්තා කිරීමට ගිය සිරස රූපවාහිනියේ මාධ්‍යවේදීන්, සිටිසන් වෙබ් අඩවියේ මාධ්‍යවේදීන් ඇතුළු මාධ්‍යවේදීන් පිරිසකට පොලිස් විශේෂ කාර්ය බලකාය අමානුෂික ලෙස පහර දුන්නේය. එම අවස්ථාව සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරමින් සිටි පිරිසකට ද පහර දෙන ලදි.

සාමකාමී උද්ඝෝෂණය ආවරණය කිරීම ආරක්ෂක අංශවල බාධාකිරීම් නිසා නතරවීමෙන් පසු රනිල් වික්‍රමසිංහගේ නිවසේ ගින්නක් හටගෙන තිබිණි. ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍යවල සිදුවීම ප්‍රචාරය වීම වළක්වා, ආරක්ෂක අංශ හෝ ආණ්ඩු හිතවාදීන් පිරිසක් විසින් ම මෙම නිවස ගිනි තබා එහි වගකීම උද්ඝෝෂකයන් මත පැටවීමට උත්සාහ කළේ ද යන්න පිළිබඳ බරපතළ සැකයක් පවතී.

## 2022 ජූලි 13දා සිට 2022 අගෝස්තු 20දා තෙක් මර්දනය

අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ගෝඨාභය රාජපක්ෂ ඉල්ලා අස්වීමෙන් පසු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ලෙස පත් විය. ගෝඨාභය රාජපක්ෂට ඉල්ලා අස්වන ලෙස කළ අරගලයට එක්සත් ජාතික පාක්ෂිකයන් ද සක්‍රීයව දායක වී සිටි අතර, රනිල් වික්‍රමසිංහ ජනාධිපති ලෙස පත්වූ පසු ඔවුහු ඉවත්ව ගියහ.

රනිල් වික්‍රමසිංහ ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුව ද මර්දනය නොවෙනස්ව ක්‍රියාත්මක වූ අතර, දිනපතා මානව හිමිකම් කඩවීමේ සිදුවීම් වාර්තා විය. ඇතැම් සාමකාමී අරගලකරුවන්ට නඩු කිහිපයක් දමමින් ඔවුන් අපහසුතාවට පත් කිරීමටත්, ඔවුන් මර්දනය කිරීමටත් ආණ්ඩුව කටයුතු කරමින් තිබේ.

අරගලකරුවන් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවා තබාගැනීම දක්වා මර්දනය සහ මානව හිමිකම් කඩකිරීම් තීව්‍ර කර තිබේ. ඇතැර්ට අදාළ සිදුවීම් කිහිපයක් පමණක් පහත දැක්වේ.

- ඇඳිරි නීතිය සහ හදිසි නීතිය නැවතත්

ජනතා අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ගෝඨාභය රාජපක්ෂ ජූලි 12දා රාත්‍රී රටින් පිටවී ගියේය. ජූලි 13දා දහවල් වන විට වත් ඔහුගේ ඉල්ලා අස්වීම හෝ වැඩ බලන ජනාධිපතිවරයෙකු පත්කළ බවක් ප්‍රසිද්ධ කර තිබුණේ නැත. එසේ තිබියදී රනිල් වික්‍රමසිංහ වැඩ බලන ජනාධිපති ලෙස හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කර, බස්නාහිර පළාතට ඇඳිරි නීතිය පැනවූ බව අගමැති කාර්යාලය උපුටා දක්වමින් ජනමාධ්‍ය වාර්තා කළේය. ඒ වන විට හදිසි නීතියට හෝ ඇඳිරි නීතියට අදාළ ගැසට් පත්‍ර ප්‍රසිද්ධ කර තිබුණේ ද නැත.

කෙසේ වෙතත් ඉන්පසුව කතානායකවරයා නිවේදනයක් නිකුත් කරමින් රනිල් වික්‍රමසිංහ වැඩ බලන ජනාධිපති ලෙස ගෝඨාභය රාජපක්ෂ විසින් පත් කර ඇති බව දැනුම් දුන්නේය.

- පාර්ලිමේන්තුව අසල විරෝධයට පහර දීම

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයෙන් 13දා ඉවත් වන බවට කතානායකවරයා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. කෙසේ වෙතත් 13දා ගෝඨාභය රාජපක්ෂ ඉවත් නොවී, වැඩ බලන ජනාධිපති ලෙස එවකට අගමැති රනිල් වික්‍රමසිංහ නම් කිරීම සම්බන්ධයෙන් විරෝධයක් පාර්ලිමේන්තු පිවිසුම අසල පොල්දූව මංසන්ධියේ දී පැවැත්විණි.

එදින රාත්‍රියේ හමුදාව සහ පොලිසිය විසින් මෙම විරෝධතාවට ප්‍රහාරයක් එල්ල කළේය. එසේ ප්‍රහාරයක් එල්ල කිරීමෙන් පසු, ඊට පසු දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේ විරෝධතාව අතරතුරදී හමුදාවේ නිලධාරියෙකුට පහර දී ඔහු සතු ගිනි අවිය සහ උණ්ඩ විරෝධතාකරුවන් විසින් පැහැරගෙන ඇති බවයි. කෙසේ වෙතත් හමුදා මාධ්‍ය ප්‍රකාශකවරයා ප්‍රකාශයක් නිකුත් කරමින් පැවසුවේ හමුදා නිලධාරීන් දෙදෙනෙකුට පහර දී ගිනි අවි 2ක් පැහැරගෙන ඇති බවයි. උද්ඝෝෂකයන් පැහැර ගත්තේ යැයි කියන ගිනි අවි සංඛ්‍යාව ගැන පොලිසිය සහ හමුදාව කළ ප්‍රකාශ අතර පරස්පරයක් පැවතිණි.

හමුදාව සතු ගිනි අවියක් පැහැරගැනීම පහසුවෙන් කළ හැකි දෙයක් නොවීමත්, මෙම අවස්ථාවට හමුදාවේ විශාල පිරිසක් පැමිණ තිබියදී ගිනි අවියක් පැහැරගෙන යන තෙක් එය ආපසු ගැනීමට කටයුතු නොකිරීමත් නිසා මෙය උද්ඝෝෂකයන් මත වරදක් පැටවීමේ අවශ්‍යතාව මත ගොතන ලද්දක් ද යන්න පිළිබඳව

බොහෝ පාර්ශ්වවලින් සැක මතුකෙරිණි. පැහැර ගත්තේ යැයි කියන ගිනි අවියක් පසුව දියවන්නාවේ තිබී හමුවූ බව ජනමාධ්‍ය වාර්තා කළේය.

- ගෝඨාගෝගම සාමකාමී විරෝධතාවට හමුදාව ලවා පහර දී විරෝධතාකරුවන් 09ක් අත්අඩංගුවට ගැනීම

මාස කිහිපයක් තිස්සේ ගාලු මුවදොර පැවැති ගෝඨාගෝගම අරගලයට මැයි 09දා ආණ්ඩු හිතවාදීන් පිරිසක් විසින් පහරදුන් ආකාරය මීට පෙර සඳහන් කළෙමු. එදා මෙන්ම ජූලි 22දා රාත්‍රියේ ද ආණ්ඩුව හමුදාව ලවා සාමකාමී අරගලයට පහර දී අට්ටාල කඩා දේපොළ විනාශ කර ඇතැම් දේපොළ පොලිස් බාරයට ගනු ලැබීය.

මෙහිදී හමුදාව අමානුෂික ලෙස සාමකාමී නිරායුධ විරෝධතාකරුවන්ට පහර දුන්නේය. පහර කෑ පිරිස අතර අරගලකරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ප්‍රමුඛතම නීතිඥවරයෙකු වන නුවන් බෝපගේ ද සිටී. අමානුෂික ලෙස පහර දී නුවන් බෝපගේ ඇතුළු නවදෙනෙකු අත්අඩංගුවට ගත් හමුදාව, ඔවුන් පොලිස් බාරයට පත්කරන ලදි. පසු දින මේ පිරිස කොළඹ - කොටුව වැඩ බලන මහේස්ත්‍රාත් ජයන්ත ඩයස් නානායක්කාර ඉදිරියට පමුණුවනු ලැබීය. අත්අඩංගුවට ගත් විරෝධතාකරුවන් නවදෙනාම රුපියල් 10,000ක් මුදල් සහ රුපියල් ලක්ෂ 5ක ශරීර ඇප 2ක් මත මුදාහැරීමට අධිකරණයෙන් නියෝග කෙරිණි. එම පිරිසෙන් දෙදෙනෙක් රෝහල්ගතව ප්‍රතිකාර ලැබූහ.

විරෝධතාකරුවන්ට අමානුෂික ලෙස පහරදෙමින් ඔවුන්ගේ තාවකාලික ඉදිකිරීම් ඉවත් කිරීම ආවරණය කිරීමට පැමිණි බීබීසී මාධ්‍ය ආයතනයේ ජනමාධ්‍යවේදියෙකු ඇතුළු අඩු තරමේ ජනමාධ්‍යවේදීන් සිව්දෙනෙකුටවත් මෙම අවස්ථාවේදී හමුදාව විසින් පහරදෙනු ලැබීය. ඒ අතර දිගටම අරගලය වාර්තා කළ එක්ස්පෝෂර් මාධ්‍ය ආයතනයේ රසික ගුණවර්ධන සහ ෂබීර් මොහොමඩ් ද වූහ. ඇතැම් ජනමාධ්‍යවේදීන්ගේ දුරකතන ආදී උපාංග හමුදාව විසින් විනාශ කරන ලදි. මාධ්‍යවේදී චතුරංග ප්‍රදීප් ඇතුළු පිරිසක් පැහැරගෙන ගොස් කොළඹ අතුරු පාරකදී වධහිංසා පමුණුවනු ලැබුවේ ද හමුදාව මගිනි.

විරෝධතාකරුවන්ට නීති සහාය ලබාදීමට ගිය නීතිඥවරයෙකුට ද ආගමික නායකයන් ඉදිරිපිටදී ම අමානුෂික ලෙස පහර දෙන ලදි. පහර කෑ විරෝධතාකරුවන් රැසකට ප්‍රතිකාර සඳහා යෑමට නොහැකි වන අයුරින් රැකවල් යොදා තිබූ අතර, ඔවුන්ට ප්‍රතිකාර ලබාගැනීමට පසුදා උදෑසන වන තුරු සිටීමට සිදු විය.

- රාජගිරිය, ඔබේසේකරපුර පදිංචිකරුවන් තිදෙනෙකු ජනාධිපති මන්දිරයට අයුතු ඇතුළු වීමේ චෝදනාව මත කොළඹ උතුර අපරාධ කොට්ඨාසයෙන් ජූලි 25දා අත්අඩංගුවට ගනු ලැබිණි.

- ගාල්ලේ අහමඩ් නිස්වාර් නම් පුද්ගලයෙකු සමාජ මාධ්‍යවල කළ පළකිරීමක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ජූලි 25දා අත්අඩංගුවට ගනු ලැබිණි. ඔහු අගෝස්තු 08 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

- කොටුව පොලිස් ස්ථානය කළ ඉල්ලීමක් සැලකිල්ලට ගෙන කොළඹ - කොටුව මහේස්ත්‍රාත් තිලිණ ගමගේ විසින් වෘත්තීය සමිති නායකයන් ඇතුළු හයදෙනෙකුට විදෙස් ගමන් තහනම් කරමින් නියෝගයක් නිකුත් කළේය. ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝෂප් ස්ටාලින්, ගාලුමුවදොර

අරගලයේ ඉදිරි පෙළ සාමාජික ජීවන්ත පීරිස් පියතුමා සහ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ ඒ අතර වූහ.

- විදේශගත වීම සඳහා කටුනායක ගුවන් තොටුපොළ ආගමන විගමන අංශයෙන් පවා නිශ්කාෂණය වී ගුවන්යානයට ඇතුළු වී සිටි ගාලුමුවදොර අරගලකරුවකු වන දානිෂ් අලි සිවිල් ඇඳුමෙන් සැරසුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් පිරිසක් විසින් පැහැරගැනීමක ස්වරූපයෙන් අත්අඩංගුවට ගන්නා ලදි. ඔහු අත්අඩංගුවට ගැනීමට හේතුවක් පැහැදිලි කර නොතිබිණි. බලහත්කාරයෙන් ඔහු රැගෙන යෑමට උත්සාහ කිරීමේදී ගුවන්යානයේ සිටි මගීහු ඊට විරෝධය පළකළහ. ජාතික රූපවාහිනියට ඇතුළු වීමේ චෝදනාව මත අධිකරණයට ඉදිරිපත් කෙරුණු දානිෂ් අලි, රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. ජාතික රූපවාහිනී බලධාරීන්ගේ අවසරය මත ඔහු ඊට ඇතුළු වී තිබූ අතර, ඔවුන්ට ආයතන බලධාරීන් විසින් තේ පැන් සංග්‍රහයක් පවා ලබාදී තිබිණි. එසේ තිබියදී අයුතු ලෙස ඇතුළු වීමේ චෝදනාව ඔහුට පොලිසිය පාර්ශ්වයෙන් එල්ල කර තිබිණි.

- ජූලි 26දා ගාලුමුවදොර බණ්ඩාරනායක පිළිමය අසල සිටි සිව්දෙනෙකු අත්අඩංගුවට ගැනිණි. පොලිසිය පැවසුවේ පිළිමය අසල සිට මීටර් 50ක් දුර සීමාවට කිසිවෙකුට ඇතුළු විය නොහැකි ලෙස අධිකරණ නියෝගයක් ලබාගෙන ඇති බවයි. අදාළ ස්ථානය පොදු ස්ථානයකි. කෙසේ වෙතත් අත්අඩංගුවට ගත් සිව්දෙනා ජූලි 29 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

- වෙරංග පුෂ්පික පැහැරගැනීම

මර්දනයට එරෙහිව කොළඹ - කොටුව දුම්රියපොළ අසල ජූලි 27දා සාමකාමී විරෝධතාවක් පැවැත්විණි. නිදහස් මාධ්‍යවේදියෙකු සහ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ ක්‍රියාකාරිකයෙකු ද වන ඇන්තනී වෙරංග පුෂ්පික ද එම විරෝධතාවට සහභාගි වී මහරගම ් කොටුව (138) බස් රථයකින් ගුරු මැදුරට පැමිණෙමින් සිටියදී බස් රථයට නැගගත් සිවිල් ඇඳුමෙන් සැරසුණු පිරිසක් විසින් ඔහු පැහැරගෙන යනු ලැබීය. සිවිල් ඇඳුමින් පැමිණි පිරිස තමන් කවුරුන්ද යන්න හඳුන්වා දී නැති අතර, ආයුධ සම්බන්ධ සිදුවීමකට වෙරංග අවශ්‍ය කෙනෙකු බව බස් රථයේ සිටි පිරිසට දැනුම් දී තිබේ. වෙරංග බලහත්කාරයෙන් වාහනයට නංවාගෙන ක්‍රීඩාංගනයක් වැනි ස්ථානයකට රැගෙන ගොස් රාත්‍රී වන තුරු තබාගෙන සිට, රාත්‍රී 8ත් 10ත් අතර කොටුව පොලිස් ස්ථානයට ගෙනැවිත් බාර දී තිබේ. කොටුව පොලිස් ස්ථානයේ පසු දින දහවල් වනතුරු රඳවා තබාගෙන තලංගම පොලිසියට බාර දී කඩුවෙල අධිකරණයට ඉදිරිපත් කර ඔහුව රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබීය. ඔහු කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන බවට පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා නිවේදනය කළ නිසා සහ පොලිසිය දැනුම් දුන් නිසා නීතිඥවරුන් ඔහු ඉදිරිපත් කරන තෙක් එහි සිටියදී, නීතිඥවරුන්ට නොදන්වා ඔහු කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම නිසා ඔහුට නීතිඥ නියෝජනයක් ලබාගැනීමේ අවස්ථාව ද අහුරා දැමිණි.

වෙරංග පුෂ්පික පැහැරගෙන යෑම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කරන ලද පැමිණිල්ලක් අගෝස්තු 22දා විමර්ශනය කළ අතර, එහිදී අනාවරණය වූයේ කොළඹ දකුණ අපරාධ කොට්ඨාසයෙන් වෙරංග අත්අඩංගුවට ගෙන ඇති බවත්, ඔවුන් කරන විමර්ශනයකට වෙරංග අදාළ නැති නිසා කොළඹ මධ්‍යම කොට්ඨාසයට බාර දුන් බවත් ය. ඒ බව කොළඹ දිසාව බාර නියෝජ්‍ය පොලිස්පති චන්ද්‍රකුමාර පිළිගත්තේය. එමෙන්ම වෙරංග පොලිසියකට රැගෙන නොගොස් ක්‍රීඩාංගනයක තබාගෙන සිටි බව ද නියෝජ්‍ය පොලිස්පතිවරයා කොමිසමේ දී පිළිගත්තේය.

- ජූලි 09දා ජනාධිපති මන්දිරයේ තිබී සොයාගත් රුපියල් එක්කෝටි හැත්තෑ පන් ලක්ෂ පනස් දහසකට ආසන්න මුදලක් ගණන් කර කොටුව පොලිස් ස්ථානාධිපතිවරයාට තරුණයන් තිදෙනෙකු විසින් බාරදෙන ලදි. එම මුදල් අධිකරණයට ඉදිරිපත් නොකර ආණ්ඩුවේ ඇමැතිවරයෙකුට ලබා දෙන ලෙස බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් දැනුම් දුන් බවට කොටුව පොලිස් ස්ථානාධිපති සාගර ලියනගේ සටහනක් තබා ඉහළ නිලධාරීන්ට ද දැනුම් දුන්නේය. ඒ අනුව දේශබන්දු තෙන්නකෝන් අත්අඩංගුවට ගැනීම වෙනුවට කොටුව පොලිස් ස්ථානය මුදල් ගණන් කර පොලිසියට බාර දුන් තරුණයන් හතර දෙනා ජූලි 27දා අත්අඩංගුවට ගනු ලැබ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළේය. තරුණයන් සිව්දෙනා ඇප මත මුදාහැරිණි.

- ශ්‍රී ලංකා හරිත පක්ෂයෙන් 2020 මහ මැතිවරණයට ඉදිරිපත් වූ අපේක්ෂකයෙකු මෙන්ම සමාජ ක්‍රියාකාරිකයෙකු ද වන වෛද්‍ය පැතුම් කර්නර් ජූලි 28දා කොළඹ අපරාධ කොට්ඨාසය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබිණි. ජූලි 13දා පාර්ලිමේන්තුව අසල පැවැති විරෝධතාවට සම්බන්ධ වීම මත ඔහු අත්අඩංගුවට ගෙන තිබූ අතර, හමුදා සාමාජිකයාගේ ගිනි අවිය පැහැර ගත්තේ ඔහු ද යන්න සම්බන්ධයෙන් හඳුනාගැනීමේ පෙරට්ටුවකට ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව පොලිසිය අධිකරණයට දැනුම් දුන්නේය. බන්ධනාගාරගත කර සිටි පැතුම් කර්නර් මුණගැසීමට ගිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන්ට බන්ධනාගාරයෙන් ඒ සඳහා අවස්ථාව සලසා දී තිබුණේ නැත.

- ජූලි 28දා අරගලකරුවන් 21 කගේ විදෙස් ගමන් තහනම් කරන ලෙස කොටුව පොලිසිය කළ ඉල්ලීමකට අනුව කොළඹ - කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඔවුන්ගේ විදෙස් ගමන් තහනම් කිරීමට නියෝග කළේය.

- ගාලුමුවදොර අරගලයට පැමිණි බව කියමින් බිංගිරිය, දෙල්ගහකන්ද, ගොතටුව සහ නුවරඑළිය ප්‍රදේශවලින් සිව්දෙනෙකු අත්අඩංගුවට ගැනිණි.

- මීට පෙර සඳහන් කළ රතිඳු සේනාරත්න හෙවත් රැට්ටා අගෝස්තු 01දා යළිත් වරක් අත්අඩංගුවට ගනු ලැබීය. කොළඹ දකුණ කොට්ඨාස අපරාධ කාර්යාංශයෙන් ඔහු අත්අඩංගුවට ගෙන තිබුණේ මැයි 21දා ලංකා බැංකු මාවතේ පැවැති විරෝධතාවක් සම්බන්ධයෙනි.

- අරගලකරුවකු වන විමුක්ති රණසිංහ කොළඹ අපරාධ කොට්ඨාසය විසින් අගෝස්තු 02දා අත්අඩංගුවට ගනු ලැබීය.

- ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝෂප් ස්ටාලින් අගෝස්තු 03දා සිය වෘත්තීය සමිති කාර්යාලයේදී 50ක පමණ පොලිස් කණ්ඩායමක් පැමිණ අත්අඩංගුවට ගෙන කොම්පඤ්ඤවීදිය

පොලිසියටත්, එතැනින් කොටුව පොලිසියටත් රැගෙන ගියේය. ස්ටාලින් අත්අඩංගුවට ගනු ලැබුවේ මැයි 28දා අධිකරණ නියෝග කඩකරමින් උද්ඝෝෂණයක් පැවැත්වීම සම්බන්ධයෙනි. අගෝස්තු 04දා රාත්‍රිය වන තෙක් කොටුව පොලිසියේ රඳවා තබාගෙන සිටි ඔහු, පැය 25කට පමණ පසු කොටුව මහේස්ත්‍රාත්වරයාගේ මහරගම පිහිටි නිවසට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබීය. අධිකරණ නියෝග කඩකිරීම් විභාග කිරීමේ බලයක් මහේස්ත්‍රාත් අධිකරණයට නැතැයි සඳහන් කරමින් නීතිඥවරුන් කළ කරුණු දැක්වීමක් සැලකිල්ලට ගත් මහේස්ත්‍රාත් අධිකරණය ඊට දින 4කට පසු ඔහු ඇප මත මුදාහැරියේය.

- ගෝඨාගෝගම ක්‍රියාකාරී අරගලකරුවකු වන බිබිලදෙනියේ මහානාම හිමියන් අගෝස්තු 03දා කිරුළපන පොලිසිය මගින් අත්අඩංගුවට ගනු ලැබීය.

- ලංකා බැංකු සේවක සංගමයේ ක්‍රියාකාරිකයන් දෙදෙනෙකු අගෝස්තු 04දා අත්අඩංගුවට ගැනිණි. පාලිත ඇටැම්පාවල සහ ධනංජය සිරිවර්ධන එසේ අත්අඩංගුවට ගැනුණු අතර, පාලිත ඇටැම්පාවල අත්අඩංගුවට ගත්තේ ඔහු කොළඹ එමින් සිටියදී වාහනය මග නතර කිරීමෙන් අනතුරුව ය. ඔහු ව කඩවත පොලිසියේ නතර කර, ධනංජය සිරිවර්ධනගේ නිවසට ගොස් නිවස වටකර ඔහු අත්අඩංගුවට ගත්තේය. දෙදෙනාම කොම්පඤ්ඤවීදිය පොලිසියට රැගෙනවිත් පසුව රාත්‍රියේදී කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඇප මත මුදාහැරිණි. ශ්‍රී ලංකා පොලිසිය බාරව කටයුතු කරන නීතිය හා සාමය අමාත්‍ය ටිරාන් අලස්ට ලබා දුන් ණයක් සම්බන්ධයෙන් මෙම පිරිස දිගින් දිගටම හඬ නගා තිබිණි. අත්අඩංගුවට ගැනීම සිදුවූයේ ඊට පළිගැනීමක් ලෙස බවට විශ්වාස කෙරේ.

- ගාලුමුවදොර අරගලයේ ක්‍රියාකාරිකයකු වූ සසිඳු සහන් තාරක අගෝස්තු 08 වැනිදා පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබීය. ප්‍රකාශයක් ලබා ගැනීමට පැමිණෙන ලෙස කළ දැනුම්දීම මත පොලිසියට ගිය ඔහු අත්අඩංගුවට ගෙන තිබිණි. ඊට පෙර ඔහුගේ නිවසට ගිය පොලිසියේ දෙදෙනෙකු ඔහුගේ සහෝදරයාගෙන් ප්‍රශ්න කර තිබිණි.

# අරගලකරුවන්ට ත්‍රස්තවාදී ලේබල් ඇලවීම

අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය අගෝස්තු 18 වැනිදා කොළඹ දී විරෝධතාවයක් පැවැත්විණි. විරෝධතා පාගමන කොම්පඤ්ඤවීදිය දෙසට සාමකාමීව යද්දී පොලිසියේ විශාල පිරිසක් පැමිණ උද්ඝෝෂකයනට පහරදී, කඳුළුගෑස් සහ ජල ප්‍රහාර එල්ල කර පලවා හැරිණි. විසිර යමින් සිටි උද්ඝෝෂකයන් 20 දෙනකු පහරදී ස්ථාන කිහිපයකදී අත්අඩංගුවට ගැණිනි. ඔවුන් රඳවා සිටින පොලිස් ස්ථාන සොයා ගැනීමට නීතිඥවරුන්ට දැඩි වෙහෙසක් දරන්නට සිදු විය.

මෙම පිරිස පොලිසි කිහිපයක රඳවා තබා ගෙන සිටි අතර ඔවුන්ගෙන් 17 දෙනකු පසු දින අධිකරණයට ඉදිරිපත් කෙරිණි. කුරුඳුවත්ත පොලිස් බාරයේ සිටි සමාජ ක්‍රියාකාරික චින්තක රාජපක්ෂ මහතා රිමාන්ඩ් කරනු ලැබූ අතර සෙසු පිරිසට ඇප නියම විය.

අධිකරණයට නොදැමූ තිදෙනා වූයේ අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ, අන්තර් විශ්ව විද්‍යාල භික්ෂු බල මණ්ඩලයේ කැඳවුම්කරු ගල්වල සිරිධම්ම හිමි සහ ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු වන හෂාන්ත ගුනතිලකයි. සිරිධම්ම හිමියන් තලංගම පොලිසියේත්, සෙසු දෙදෙනා පැලියගොඩ පොලිසියේත් රඳවා තබාගෙන සිටි අතර, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ පොලිස් අධිකාරිවරයකුට ඉහළ නිලධාරියකුගෙන් ලබාගත් රැඳවුම් නියෝගක් මත තිදෙනාම පැය 72ක් රඳවාගෙන ප්‍රශ්න කරන බව පසුව පොලිසිය නිවේදනය කළේය.

වසන්ත මුදලිගේ ඇතුලු පිරිස අත්අඩංගුවට ගනු ලැබුවේ උද්ඝෝෂණයෙන් පසු විසිර යද්දීය. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ සැකකරුවකු අත්අඩංගුවට ගත යුත්තේ පොලිස් අධිකාරීවරයකුගේ නියෝගයක් මත උප පොලිස් පරීක්ෂකවරයකුට ඉහළ නිලධාරියකු විසින් වුවද මූලිකව අත්අඩංගුවට ගැනීම සිදුවූයේ ඒ ආකාරයට නොවේ.

ඔවුන් වෙනුවෙන් ලබා ගත් බව කියන පැය 72ක රැඳවුම් කාලය 21වැනිදා සවස 4ට අවසන් විය. කෙසේ වෙතත් රැඳවුම් නියෝගයක් ඉදිරිපත් නොකර 23 වැනිදා පස්වරුව වන තුරු පොලිස් බාරයේ සැකකරුවන් තබා ගත් පොලිසිය, එදින සවස නිවේදනය කළේ ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ජනාධිපතිගෙන් ලබාගත් දින 90ක රැඳවුම් නියෝග මත විමර්ශන සිදු කරන බවයි.

ඔවුන් තංගල්ලේ රැඳවුම් මධ්‍යස්ථානයක රඳවාගෙන සිටින බව 23 වැනිදා පොලිසිය නිවේදනය කළේය. සැකකරුවකු බැලීමට ඥාතීන්ට අවස්ථාව ඇති බව ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ සඳහන් වුවද, පොලිසිය මෙම තිදෙනාගේ නීතිඥවරයාට ලිපියක් නිකුත් කරමින් සඳහන් කළේ ඔවුන් තිදෙනා බැලීමට අවස්ථාව ඇත්තේ ළඟම ඥාතීන් බවට ග්‍රාම නිලධාරී විසින් සහතික කරනු ලබන අයට බවයි.

අරගලයට සම්බන්ධ වූ ශිෂ්‍ය ක්‍රියාකාරීන් ත්‍රස්තවාදීන් සේ සලකා ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ කටයුතු කිරීම සම්බන්ධයෙන් විරෝධය දක්වමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, තානාපති කාර්යාල සහ අන්තර් ජාතික සංවිධාන නිවේදන නිකුත් කර තිබේ.

# විරෝධතාවලට විෂ සහිත කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම

ශ්‍රී ලංකාවේ උද්ඝෝෂණ විසුරුවා හැරීමට බහුල වශයෙන් සිදුකරන්නේ කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කිරීමයි. අප්‍රේල් 01දා සිට අගෝස්තු 20දා දක්වා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර විසුරුවා හරින ලද උද්ඝෝෂණ ගණන 19කි.

එම ලැයිස්තුව පහත දැක්වේ.

| Date | Location | Details about the protest |
|---|---|---|
| 3rd April, 2022 | Galaha Junction, opposite the University of Peradeniya | A protest was organized by the main student body of the University of Peradeniya Staff from the Peradeniya Teaching Hospital also supported it. |
| 4th April,2022 | close to the Carlton House in Tangalle. | A protest was held demanding the government resign and also against the mismanagement of the economy. |
| 8th April, 2022 | Parliamentary roundabout, | The students of University of Kelaniya protested demanding a solution to the country's economic crisis and against the government. |
| 19th April,2022 | Rambukkana | Private Bus employees(Lanka Private Bus Owners Association) protested against the fuel price hike and the shortage of fuel by stepping away from their operations. |
| 19th of April,2022 | Matara Town | A group of people protested against the fuel price hike and the shortage of fuel. |
| 5th May, 2022 | close to the Parliament. | Inter-University Students Federation marched from the University of Sri Jayawardenapura demanding the resignation of the President and the Government. |

| | | |
|---|---|---|
| 19th May,2022 | at World Trade Centre | Inter University Students Federation (IUSF) protested in Colombo against the President, Prime Minister, and the Government. A protest march began from the University of the Visual and Performing Arts in Colombo and then marched to Town Hal, Maradana, Technical Junction, and reached the Fort Railway Station. |
| 21st May, 2022 | near the World Trade Centre in Colombo. | |
| 28th May, 2022 | near the World Trade Centre in Colombo. | |
| 29th May, 2022 | near the World Trade Centre in Colombo. | The protest was held under the theme 'No to deal politics that protects thieves, bow to the public opinion' which had been commenced from near the Nelum Pokuna Theater. |
| 9th June, 2022 | opposite Police headquarters. | A protest was held demanding justice for the attack on GotaGoGama on 9th May |
| 10th June, 2022 | opposite the Education Ministry in Pelawatte, Battaramulla | Inter University Students' Federation protested against unjust actions at the Ruhuna and Kelaniya universities, and the unjust punishments on students. |
| 6th July,2022 | | Hirunika Premachandra, accompanied by Vice Chairman of the SJB youth wing Rehan Jayawickreme and a group of women protested peacefully in front of the President's official residence against the government and demanding the resignation of the president. |

| | | |
|---|---|---|
| 6th July.2022 afternoon, | at the parliament entry road near Diyatha Uyana | A protest march had been organized by the joint trade unions for the protection of petroleum resources. |
| 8th July, 2022 | at the entrance to Bank of Ceylon Mawatha, Colombo. | Thousands of students from the Inter University Students Federation (IUSF) began a protest in Kelaniya in the morning calling for the immediate resignation of President Gotabaya Rajapaksa and Prime Minister Ranil Wickremesinghe. |
| 9th July, 2022, | in front of the President's Office near Galle Face Green in Colombo | |
| 13th July,2022 | near the Prime Minister's Office in Colombo | The protesters had marched from the Galle Face protest site towards the Prime Minister's Office on Flower Road and engaged in a protest outside the premises. |
| 13th July,2022 | Polduwa Junction in Battaramulla, near the entry road to the Parliament | |
| 18th August | Slave Island | Inter-University Student Federation (IUSF) has organized a protest march |

මෙම කඳුළු ගෑස් ප්‍රහාරවලින් පසු බොහෝදෙනෙකුට අසාත්මිකතා ඇතිවීම සම්බන්ධයෙන් බරපතළ චෝදනා එල්ල විය. ඒ අනුව සමාජ සහ සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලීම් යොමු කරමින් මේ සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා සිටියේය.

මෙහි මුල් තොරතුරු ඉල්ලීම් 03 මගින් පොලිස් සැපයුම් කොට්ඨාසය, පොලිස් මූලස්ථානය සහ පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයෙන් 2022 වසරේදී කඳුළු ගෑස් මිලදීගැනීම් සහ ඒවායේ තාක්ෂණික ඇගයීම් සම්බන්ධයෙන් තොරතුරු විමසන ලදි. තොරතුරු නිලධාරීන් සහ නම් කළ නිලධාරි ලෙස පොලිස්පතිවරයා තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර නොදැක්වීම නිසා තොරතුරු කොමිෂන් සභාවට අභියාචනා කරන ලදි.

අභියාචනය විභාග කිරීමට දින කිහිපයකට පෙර, තොරතුරු පනතේ පස්වැනි වගන්තියේ ව්‍යතිරේක පෙන්වා දෙමින් පොලිසිය තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළේය. කොමිෂන් සභා අභියාචනයේදී නැවත වරක් තම ස්ථාවරය වෙනස් කළ පොලිසිය, 2022 වසරේදී කඳුළු ගෑස් මිලදී ගැනීමක් කර නැති බව ප්‍රකාශ කළේය.

2010 සිට 2022 වසර දක්වා කඳුළු ගෑස් මිලදී ගැනීම් සහ කඳුළු ගෑස් භාවිත කළ ප්‍රමාණයන් ගැන තවත් තොරතුරු ඉල්ලීම් 03ක් පොලිසියට යොමු කළ අතර, එක් ඉල්ලීමකට අදාළ ව තොරතුරු ලබාදීම පොලිසිය ප්‍රතික්ෂේප කළේය. අවුරුදු 5ක් සම්පූර්ණ වන ලියවිලි විනාශ කරන බැවින් කඳුළු ගෑස් මිලදී ගැනීම ගැන තොරතුරු ලබාදීමේ හැකියාවක් නැතැයි ශ්‍රී ලංකා පොලිසියේ පරිපාලනය බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දැනුම් දුන්නේය. 2022 සිට අවුරුදු 5කට පෙර තොරතුරු විනාශ කර ඇතැයි දැනුම් දීමෙන් තහවුරු වන්නේ අවුරුදු 5ක් ඇතුළත කඳුළු ගෑස් මිලදී ගෙන නැති බවයි.

එසේ නම් පොලිසිය පසුගිය උද්ඝෝෂණවලට එල්ල කර ඇත්තේ අවුරුදු 5කට පෙර මිලදී ගත් කඳුළු ගෑස් විය යුතුය. සාමාන්‍යයෙන් කඳුළු ගෑස් අවුරුදු පහකින් කල් ඉකුත් වීම සිදු වේ. එසේ නම් උද්ඝෝෂකයන්ට එල්ල කර ඇත්තේ කල් ඉකුත් වූ කඳුළු ගෑස් බවට මතු වූ සැකය මේ කරුණු මගින් සනාථ වේ.

පොලිසිය තොරතුරු පනත අනුගමනය නොකිරීම සහ තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු කොමිෂන් සභාව අභියාචනා විභාගය පවත්වන අතර, පොලිසියට එරෙහිව නඩු පවරන ලෙස කොමිෂන් සභාවෙන් මේ වන විටත් ඉල්ලීමක් කර තිබේ.

# මෑතකදී සිදුවූ වෙඩි තැබීම්

මෑත කාලීනව කොළඹ සහ දකුණු පළාතේ වෙඩි තැබීම් රැසක් සිදු විය. ජනාධිපතිවරයා විසින් විරෝධතා නොතකා සිවිල් ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදාව කැඳවා තිබියදී මෙම වෙඩි තැබීම් දිගින්-දිගටම සිදුවීම බරපතළ තත්ත්වයකි. එමගින් පුරවැසියන් දැඩි අනාරක්ෂිත බවකට පත්වී තිබේ. විරෝධතාකරුවන් ඝාතනය කිරීමට හෝ බිය කිරීම සඳහා මෙවැනි ඝාතන සිදුවීමට ඉඩ හැර ඇත්ද යන්න ගැන බරපතළ සැකයක් පවතී.

මැයි 30දා සිට අගෝස්තු 20දා දක්වා පමණක් එසේ වෙඩි තබා ඝාතනය කිරීමේ සිදුවීම් 22ක් වාර්තා විය. මෑතකදී සිදු වූ වෙඩි තැබීම් ලැයිස්තුව පහත දැක්වේ.

| Date | Where Shooting reported in | Details about the deceased |
|---|---|---|
| 3rd June | Moragalla area in Aluthgama | a 42-year-old man |
| 3rd June,2022 | Nirmala Mawatha area in Panadura | a 31-year-old man has been shot dead in the |
| 4th June,2022 | Panchalaya, Ahangama | 27 year old man, a resident of Dikwella |
| 5th June, 2022 | Motaketiara in Tangalle | |
| 6th June,2022 | Modara,Colombo | A 23 year old person |
| 18th June, 2022 | Neluwa, Galle | A 30-year-old man from Morawaka |
| 21st June | at the Manning Market in Peliyagoda | A 42-year-old man, a businessman commonly known as Umber Shan, who owns several fruit stalls at the Manning Market, a resident of Kotahena. |
| 29th June, | Katubedda Junction in Moratuwa. | two people, who were travelling in a van, |
| 4th July,2022 | Bemmulla in the Gampaha District | |
| 12th July,2022 | New Chetty Street in Colombo, | An underworld criminal identified as Kimbula-Ele |

| | | |
|---|---|---|
| | within the Coastal police area. | Pradeep, 30-year-old, a resident of Madampitiya Road, Colombo 15 |
| 26th July,2022 | Urawatte area in Ambalangoda. | a 30-year-old |
| 27th July | inside a residence at Silva Mawatha in Ratmalana | A 30-year-old |
| 27th July | in front of the Gampaha Magistrate's court | Four people including underworld gangster Saman Rohitha alias 'Pas Podda' who had appeared before the court over a case |
| 30th July | in Vivekananda Road (Foreshore Police Area), Kotahena Colombo. | 51-year-old man was shot dead |
| 1st August | Karamba Bridge in the Norochcholai area | a 56-year-old resident of Madurankuliya who was receiving treatment in the hospital |
| 1st August,2022 | Solomon area in Eechankulam | a 32-year-old women, resident of Kalmaduwa, Vavuniya |
| 2nd August | near Bank Junction in Mulleriyawa | Sumudu Rukshan, a Sri Lanka Podujana Peramuna (SLPP) member of the Kotikawatte Mulleriyawa |
| 4th August | inside the Mount Lavinia court premises | |
| 4th August | inside a hotel in Ahangama | a 44 year old male |
| 5th August | in Lunugamwehera. | 34 year old |
| 6th August | Gampaha, Kehelbaddara area. | a 22 year old |

## මෑතකදී මළ සිරුරු ගොඩගැසීම්

අප්‍රේල් 01දා සිට අගෝස්තු 01දා දක්වා කාලයේදී මිය ගිය පුද්ගලයන්ගේ සිරුරු 08ක් මුහුදු වෙරළට ගොඩගසා තිබියදී හමු විය. මේ සම්බන්ධයෙන් පොලිසිය විසින් සිදුකරන විමර්ශන පිළිබඳව කිසිම තොරතුරක් ප්‍රසිද්ධ කර නැත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද මේ පිළිබඳ විමර්ශනය කරන ලෙෂ ලිඛිත ව දැනුම් දී ඇත.

ඉහත සඳහන් කළ කාලයට අදාළ ව මළ සිරුරු වෙරළට ගොඩගැසීම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| Date found | Found in/location | Details about the deceased | Other information |
|---|---|---|---|
| 25th April,2022 | at Cross Road Lane in Templers Road, Mount Lavinia | a 28-year-old resident of Badovita | The body of a man believed to have been murdered after being attacked on the head with a sharp object has been found. Investigations have revealed that the man had been employed as a driver at an apparel factory in the Nedimala area in Dehiwala. No suspects have been arrested as yet in connection to the murder, while the Mount Lavinia Police are conducting further investigations into the incident. |
| 28th May,2022 | on the shore of Crow Island, Mattakkuliya, Colombo district, Western Province | Male, assumed to be around 38 years of age and 5 foot 7 inches in height (found wearing orange trousers and a black shirt) | The body has been transferred to the Colombo National Hospital for a post-mortem examination to be conducted. The Mattakuliya Police has lunched an investigation into an unidentified body of a male that was found. |
| 11th June,2022 | hanging inside a compartment of a train parked at the Rambukkana railway station | male, around 60 years old (found wearing a white sarong and a red-black mixed long sleeve shirt) | The body was found around 4:40 am during a routine inspection done by the driver's assistant, before start of operation.<br>A train ticket from Polgahawela to Bandarawela was found in the possession of the deceased. |
| 26th July | Wellawatta beach | 34 year old, Male, a resident of Meethotamulla | As police said, 2 court cases has been already ongoing |
| 29th July, 2022 | Galle Face, Colombo | a 19-year-old | |

| | | | |
|---|---|---|---|
| | district, Western Province | | |
| 1st August,2022 | Galle Face, Colombo district, Western Province | Male | The body had been sent to National Hospital in Colombo. |
| 16th August | on the shores in Ratmalana | Male | The Police are conducting further investigations into the incident. |
| 16th August | Mahaweli River in the Moragolla area in Gampola. | a 22-year-old girl who had been reported missing from the Malimbada area | The body has been found while floating in the river. |